# මූලික පිරිවෙන් අවසාන විභාගය

# ඇගයීම් වාර්තාව

# 03- ත්‍රිපිටක ධර්මය

# 2020

Curriculum
Assessment
&
Evalution
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත අනුව මූලික පිරිවෙන් විෂයමාලාව සිංහල, පාලි, සංස්කෘත, ත්‍රිපිටක ධර්මය, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන හර විෂයයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

අ.පො.ස (සා.පෙළ) මට්ටමේ පවතින මූලික පිරිවෙන් අවසාන විභාගය සමත් වීම අ.පො.ස (උ.පෙළ) විභාගය හෝ ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සඳහා විද්‍යායතනයක හෝ මහා පිරිවෙනක අධ්‍යාපන ලැබීමට හැකි මගක් වේ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා පරිවෙණාචාර්යවරුන් ද දැඩි වෙහෙසක් දරති. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මූලික පිරිවෙන් අවසාන විභාගය - 2020 සඳහා සකස් කරන මෙම ඇගයීම් වාර්තාව ඔවුන්ගේ එම අපේක්ෂා ඉටු කර ගැනීම පිණිස හේතු වනු ඇතැයි විශ්වාස කරමි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරුභවතුන්ට, පරිවෙණාචාර්යවරුන්ට, විෂයභාර පිරිවෙන් අධ්‍යක්ෂවරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු ඇත. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාවේ අන්තර්ගතය ප්‍රධාන මාතෘකා 5ක් යටතේ ගොනු කර ඇත.
මූලික පිරිවෙන් ත්‍රිපිටක ධර්මය විෂයයෙහි විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ප්‍රථම මාතෘකාව යටතේ අන්තර්ගත වේ. ඒ යටතේ විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික්ක අනුව පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය සංඛ්‍යාත්මකව දක්වා ඇත. මෙම ඇගයීම් වාර්තාවේ දෙවන මාතෘකාව යටතේ I ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද තෙවන මාතෘකාව යටතේ II ප්‍රශ්න පත්‍රයට අදාළ විශ්ලේෂණය ද අන්තර්ගත වේ.

IIවන මාතෘකාව යටතේ I පත්‍රයේ ව්‍යූහය , I ප්‍රශ්න පත්‍රය, I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය , I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය, ප්‍රශ්නවල වරණ තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය හා ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණයත් අවසාන ලෙස I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ද අන්තර්ගත වේ. තෙවන මාතෘකාවෙන් ඉදිරිපත් කර ඇති II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය යටතේද I ප්‍රශ්න පත්‍රයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර ඇති අතර මෙහිදී එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනාද එක් එක් ප්‍රශ්නයෙහි කොටස් හා අනුකොටස්වල පහසුතාව ද වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි හතරවන හා පස්වන මාතෘකා යටතේ විග්‍රහ කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව අවබෝධ කරගැනීමට මෙය මහත් සේ උපකාරී වනු ඇතැයි සිතමි.

උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයින්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරුද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

මෙම වාර්තා සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ ලේඛක හා සංස්කරණ මණ්ඩල සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

2023 ජුනි 30

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර
විභාග කොමසාරිස් ජනරාල්

# පෙරවදන

යටත් විජිත යුගයේ දායාදයක් ලෙස දක්නට ලැබෙන වර්තමානයේ ක්‍රියාත්මක මෙරට ජාතික අධ්‍යාපන ක්‍රමය පාසල් පද්ධතිය පාදක කොටගෙන බිහිවූවත් ඉපැරණි ඓතිහාසික යුගයේ ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය වූයේ පිරිවෙනයි.

භික්ෂූන් වහන්සේලා විසින් තමන්ගේ ආරාමය තුළ පවත්වාගෙන යනු ලබන අධ්‍යාපනික ආයතන විශේෂයක් වූ පිරිවෙන පර්යප්ති, ප්‍රතිපත්ති හා ප්‍රතිවේද යන ත්‍රිවිධ ශාසනය පවත්වාගෙන යාම, එය පෝෂණය කිරීම, ඒ හා සම්බන්ධ අවශේෂ අවශ්‍යතා වන විනය හා ත්‍රිපිටක ඥානය ලබා දීම, ධර්ම ගරුක බවකින් යුත් භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන් හි නිරත වීම හා බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, පාලි, සංස්කෘත ඇතුළු භාෂා හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනුම ලබා ගැනීම සඳහා පහසුකම් සලසා දීම යන මූලික දැ අරමුණු කොටගෙන පිහිටුවා ඇත.

මෙසේ පිහිටුවන ලද ප්‍රධාන පිරිවෙන් මගින් බෞද්ධ අධ්‍යාපනයේ දියුණුවට හා භාෂා සාහිත්‍යයේ වර්ධනයට අනුපමේය සේවාවක් සිදු වූ බැවින් ශාස්ත්‍ර පිපාසයෙන් සිටි විදේශ ශිෂ්‍යයන් පවා මෙම පිරිවෙන්වල අධ්‍යාපනය ලබා ගැනීමට 14 හා 15 සියවස් තුළ ශ්‍රී ලංකාව පැමිණ ඇත. තොටගමුවේ විජයබා, කැරගල පද්මාවතී, වීදාගම සිරි ඝනානන්ද, දෙවිනුවර තිලක හා පැපිළියානේ සුනේත්‍රාදේවි යන පිරිවෙන් එකල පැවති ප්‍රසිද්ධ පිරිවෙන් කිහිපයක් වේ.

කාලයේ ඇවෑමෙන් යම් යම් වෙනස්කම්වලට ලක් ව වල් බිහි වූ පිරිවෙන් අධ්‍යාපනය නැවත නගා සිටු වූයේ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ දායකත්වයෙනි. සම්ප්‍රදායක හරයන් ආරක්ෂා කර ගනිමින් ස්වකීය අධ්‍යාපන ක්‍රමය වර්තමානයට උචිත වන පරිදි සජීවී හා කාලය විසින් බැහැර කරනු නොලබන හරයන් මත පිහිට වූ පරමාර්ථ ඵලදායී ලෙස ඉටු කර ගත හැකි ලෙස පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සකස් විය. මේ ආකාරයට 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව මූලික පිරිවෙන් විෂය මාලාවක් නිර්මාණය වූ අතර එය සිංහල, පාලි, ත්‍රිපිටක ධර්මය, සංස්කෘත, ඉංග්‍රීසි භාෂාව හා ගණිතය යන හර විෂයන් හයකින් ද ඉතිහාසය, භූගෝල විද්‍යාව, සාමාන්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, සමාජ විද්‍යාව හා දෙමළ යන වෛකල්පික විෂයයන් හයකින් ද සමන්විත වේ.

මූලික පිරිවෙන් අවසාන විභාගය පළමු වතාවට වර්ෂ 1981දී පවත්වන ලදි. ඒ සඳහා අපේක්ෂකයන් 362ක් පෙනී සිටි අතර ඉන් අපේක්ෂකයන් 227ක් විභාගය සමත් විය.

වර්තමානයේ දී සාමාන්‍ය පෙළ විභාගය හා සම මට්ටමේ ලා සලකනු ලබන මෙම විභාගයේ දී අපේක්ෂයෙකු අනිවාර්ය විෂයයන් 06ක් සමග යටත් පිරිසෙයින් වෛකල්පික විෂයයන් දෙකක්වත් තෝරා ගත යුතුය. විභාගය සඳහා පෙනී සිටිය හැකි උපරිම විෂයයන් ගණන 10කි. මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලබන අතර ත්‍රිපිටක ධර්මය විෂයය සමග පාලි හෝ සිංහල ඇතුළු විෂයයන් 06කින් සමත් විය යුතුය. එසේ නොවී විෂයයන් 05ක් සමත් වුවහොත් ඌන සාමර්ථ්‍යය හිමි වන අතර වර්ෂ දෙකක් ඇතුළත එම ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කළ යුතුය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මූලික පිරිවෙන් අවසන් විභාගය සඳහා 2019 වර්ෂයේ සිට ඉදිරිපත් කරනු ලබන මෙම ඇගයීම් වාර්තා පද්ධතියේ ගුරු, ශිෂ්‍ය, නිලධාරින්ගේ අවබෝධය පිණිස හා ත්‍රිවිධ ශාසනයේ පැවැත්ම උදෙසා ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලා තනන පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ චිරස්ථිතිය පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කරමි.

පර්යේෂණ හා සංවර්ධන (ආයතනික විභාග) ශාඛාව
පර්යේෂණ හා සංවර්ධන අංශය
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා අධීක්ෂණය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| සම්බන්ධීකරණය හා සංවිධානය | : | ඩී. ඩී. වයි. සමරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන - ආයතනික විභාග |
| විෂය සම්බන්ධීකරණය | : | ඩබ්. එස්. ඩී වීරසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| සංස්කරණය | : | පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල |
| ලේඛක මණ්ඩලය | : | පූජ්‍ය අමුණුපුරේ සීලවංස හිමි<br>විශ්‍රාමික පීඨාධිපති<br>රත්මුතුගල මහා විහාරය<br>රත්මුතුගල,<br>කඩවත<br><br>පූජ්‍ය කළහේ පඤ්ඤානන්ද හිමි<br>පරිවේණාධිපති<br>ත්‍රිපිටක ධර්ම විෂය(අ.ප්‍රධාන පරීක්‍ෂක)<br>ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස අනුස්මරණ මූලික පිරිවෙන,<br>අන්දරගස්යාය |
| පරිගණක පිටපත සැකසුම | : | ඩී. ඒ. අයේෂා මධුවන්ති<br>දත්ත සටහන් සහකාර |
| පිටකවරය නිර්මාණය | : | ආර්. එම්. නිලුපුල් ශෙහාන් යසරත්න<br>දත්ත සටහන් සහකාර |

## පටුන

පිටු අංකය

**1. ත්‍රිපිටක ධර්මය විෂය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු** 1
1.1 ත්‍රිපිටක ධර්මය විෂය අධ්‍යයනයේ අරමුණු 1
1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු 2
1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2
1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය 5
**2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** 6
2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 6
2.2 I ප්‍රශ්න පත්‍රය ( ප්‍රශ්න 1 සිට 40 දක්වා) 7
2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 11
2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය 12
2.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 13
2.6 ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා තේමා අනුව විශ්ලේෂණය 14
2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 16

II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණ 18
**3. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු** 19
3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 19
3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 20
3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 21
3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය පිළිබඳ විශ්ලේෂණය 22
3.5 II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය 23
3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 40

**4. පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයින් අවධානය යොමුකළ යුතු කරුණු** 41
**5. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා** 42

# 1. ත්‍රිපිටක ධර්මය විෂයය අධ්‍යයනයේ අරමුණු හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

## 1.1 ත්‍රිපිටක ධර්මය විෂයය අධ්‍යයනයේ අරමුණු

1. ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවත් ව හා යථාර්ථවාදීව කටයුතු කරන, නිවැරදි ප්‍රායෝගික වතාවත්වල යෙදෙන භික්‍ෂු හා ගිහි පරපුරක් බිහි කිරීම.

2. ජීවන ගමනේ දී මුහුණපාන අභියෝග ජයගැනීමට හා නිවැරදි යහපත් ජීවන රටාවක් ගොඩනගා ගැනීමට බුදු දහමේ මූලික ඉගැන්වීම උපයෝගී කොටගෙන සිව්වනක් පිරිසේ යහපත් ආදර්ශ ද එක්කොට ගත් දහැමි පරපුරකට මඟ පෙන්වීම.

3. නිවැරදි හා යහපත්, ආදර්ශවත්, යථාර්ථවාදී භික්‍ෂු ජීවිතයක් ගොඩනගා ගැනීමට භික්‍ෂු විනය හා ශික්‍ෂාපද ප්‍රගුණ කිරීමට මඟ පෙන්වීම.

4. බෞද්ධ ත්‍රිපිටකාගත සූත්‍ර අධ්‍යයනයකොට භික්‍ෂු ජීවිතය සාර්ථක කරගැනීමටත් ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් ඒ තුළින් සුපෞරුෂයක් ගොඩනගා ගැනීමටත් මඟ පෙන්වීම.

5. ධම්මපද ගාථා අධ්‍යයනයකොට ආදර්ශ සපයාගනිමින් භික්ෂු ජීවිතය සාර්ථක කර ගැනීමටත්, ගිහි ජීවිත සාර්ථක කර ගැනීමට ධර්ම දේශනා කිරීමටත් මඟ පෙන්වීම.

6. ශ්‍රී ලාංකේය හා බෞද්ධ සංස්කෘතික උරුමය හැඳින, ශාසනික උරුමය රැකගැනීමත්, ඒවා පවත්වා ගැනීමටත් අවශ්‍ය ආදර්ශ සපයන භික්‍ෂු හා ගිහි සිසු පිරිසක් බිහිකිරීම.

7. මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

8. සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කොටගෙන ප්‍රායෝගික භික්ෂු ජීවිතයක් ගොඩනගා ගැනීමටත්, ගිහි ජනතාවට මඟ පෙන්වීමටත් අවශ්‍ය ශක්තිය ලබාදීම.

ත්‍රිපිටක ධර්මය විෂය නිර්දේශය (2017)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පිරිවෙන් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 2425 | 27 | 2452 |
| ඉංග්‍රීසි | 18 | 00 | 18 |
| එකතුව | **2443** | **27** | **2470** |

වගුව 1.1

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පිරිවෙන් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 134 | 5.49 | 1 | 3.70 | 135 | 5.47 |
| B | 233 | 9.54 | 3 | 11.11 | 236 | 9.55 |
| C | 917 | 37.54 | 7 | 25.93 | 924 | 37.41 |
| S | 760 | 31.11 | 13 | 48.15 | 773 | 31.30 |
| W | 399 | 16.33 | 3 | 11.11 | 402 | 16.28 |
| එකතුව | **2443** | **100.00** | **27** | **100.00** | **2470** | **100.00** |

වගුව 1.2

## 1.2.3 පිරිවෙන් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමාර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන (B) සාමාර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමාර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමාර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 149 | 14 | 9.40 | 25 | 16.78 | 63 | 42.28 | 34 | 22.82 | 136 | 91.28 | 13 | 8.72 |
| ගම්පහ | 210 | 9 | 4.29 | 21 | 10.00 | 69 | 32.86 | 73 | 34.76 | 172 | 81.90 | 38 | 18.10 |
| කළුතර | 167 | 16 | 9.58 | 16 | 9.58 | 70 | 41.92 | 43 | 25.75 | 145 | 86.83 | 22 | 13.17 |
| මහනුවර | 298 | 27 | 9.06 | 41 | 13.76 | 115 | 38.59 | 84 | 28.19 | 267 | 89.60 | 31 | 10.40 |
| මාතලේ | 83 | 1 | 1.20 | 3 | 3.61 | 33 | 39.76 | 37 | 44.58 | 74 | 89.16 | 9 | 10.84 |
| නුවරඑළිය | 40 | 1 | 2.50 | 1 | 2.50 | 13 | 32.50 | 17 | 42.50 | 32 | 80.00 | 8 | 20.00 |
| ගාල්ල | 202 | 12 | 5.94 | 24 | 11.88 | 68 | 33.66 | 61 | 30.20 | 165 | 81.68 | 37 | 18.32 |
| මාතර | 164 | 13 | 7.93 | 14 | 8.54 | 54 | 32.93 | 56 | 34.15 | 137 | 83.54 | 27 | 16.46 |
| හම්බන්තොට | 128 | 4 | 3.13 | 11 | 8.59 | 48 | 37.50 | 46 | 35.94 | 109 | 85.16 | 19 | 14.84 |
| වවුනියාව | 02 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 50.00 | 0 | 0.00 | 1 | 50.00 | 1 | 50.00 |
| අම්පාර | 74 | 3 | 4.05 | 9 | 12.16 | 29 | 39.19 | 25 | 33.78 | 66 | 89.19 | 8 | 10.81 |
| ත්‍රිකුණාමලය | 21 | 0 | 0.00 | 1 | 4.76 | 5 | 23.81 | 8 | 38.10 | 14 | 66.67 | 7 | 33.33 |
| කුරුණෑගල | 244 | 12 | 4.92 | 15 | 6.15 | 92 | 37.70 | 77 | 31.56 | 196 | 80.33 | 48 | 19.67 |
| පුත්තලම | 56 | 0 | 0.00 | 3 | 5.36 | 12 | 21.43 | 24 | 42.86 | 39 | 69.64 | 17 | 30.36 |
| අනුරාධපුර | 164 | 5 | 3.05 | 17 | 10.37 | 64 | 39.02 | 43 | 26.22 | 129 | 78.66 | 35 | 21.34 |
| පොළොන්නරුව | 52 | 1 | 1.92 | 1 | 1.92 | 12 | 23.08 | 16 | 30.77 | 30 | 57.69 | 22 | 42.31 |
| බදුල්ල | 115 | 9 | 7.83 | 5 | 4.35 | 41 | 35.65 | 38 | 33.04 | 93 | 80.87 | 22 | 19.13 |
| මොණරාගල | 84 | 0 | 0.00 | 3 | 3.57 | 46 | 54.76 | 26 | 30.95 | 75 | 89.29 | 9 | 10.71 |
| රත්නපුර | 114 | 6 | 5.26 | 16 | 14.04 | 45 | 39.47 | 35 | 30.70 | 102 | 89.47 | 12 | 10.53 |
| කෑගල්ල | 103 | 2 | 1.94 | 10 | 9.71 | 44 | 42.72 | 30 | 29.13 | 86 | 83.50 | 17 | 16.50 |
| සමස්ත ප්‍රතිඵලය | 2470 | 135 | 5.47 | 236 | 9.55 | 924 | 37.41 | 773 | 31.30 | 2068 | 83.72 | 402 | 16.28 |

**වගුව 1.3**

### 1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 3 | 0.12 | 2470 | 100.00 |
| 81 - 90 | 27 | 1.09 | 2467 | 99.88 |
| 71 - 80 | 95 | 3.85 | 2440 | 98.79 |
| 61 - 70 | 215 | 8.70 | 2345 | 94.94 |
| 51 - 60 | 443 | 17.94 | 2130 | 86.23 |
| 41 - 50 | 586 | 23.72 | 1687 | 68.30 |
| 31 - 40 | 553 | 22.39 | 1101 | 44.57 |
| 21 - 30 | 385 | 15.59 | 548 | 22.19 |
| 11 - 20 | 153 | 6.19 | 163 | 6.60 |
| 01 - 10 | 10 | 0.40 | 10 | 0.40 |
| 00 - 00 | 0 | 0.00 | 0 | 0.00 |

**වගුව 1.4**

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- 31 - 40 පංති ප්‍රාන්තරය සැලකීමේදී,
මෙම විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් 2470 අතුරෙන් 31- 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 553කි. එය ප්‍රතිශතයක් වශයෙන් 22.39%කි. ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 1101ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 44.57%කි.

# I ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 2. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**I පත්‍රය - කාලය : පැය 01 යි.**

**වරණ 4 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.**
**එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.**

සැලකිය යුතුයි :

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. බුදුරජාණන් වහන්සේ හිමිදිරියේ ම තමන් වහන්සේගෙන් පිහිට ලැබීමට අද කවරෙකු සුදුසු වන්නේ දැයි සමාපත්තියට සමවැදී විමසා බලන සේක. එසේ විමසා බලන්නේ තමන් වහන්සේගේ
   - (1) මහා ප්‍රඥාවෙනි.
   - (2) මහා කරුණාවෙනි.
   - (3) අකම්පිත මහා ගුණයෙනි.
   - (4) නැදී ගුණයෙනි.

2. බුදුරජාණන් වහන්සේ විය හැකි දේ සහ නොවිය හැකි දේ නිවැරදිව දන්නා සේක. එම හේතු අහේතු ඇති සැටියෙන් දන්නා බව
   - (1) නානාධාතු පටිවේධ ඤාණයයි.
   - (2) නානාධිමුත්තික ඤාණයයි.
   - (3) සබ්බත්ථගාමිණි පටිපදා ඤාණයයි.
   - (4) ඨානාඨාන ඤාණයයි.

3. බුදුරජාණන් වහන්සේට පමණක් සාධාරණ වූ සවි අසාධාරණ ඤාණ අතර "ආසයානුසය ඤාණය" ලෙස හඳුන්වන්නේ,
   - (1) සියලු ධර්ම සමූහය නිරවශේෂ කොට දක්නා නුවණයි.
   - (2) සංඛත, අසංඛත ධර්මයන් ආවරණ නොමැතිව දක්නා නුවණයි.
   - (3) යහපත් අයහපත් අදහස් හා කෙලෙස් අනුසය දක්නා නුවණයි.
   - (4) ඉන්ද්‍රියයන්ගේ සිදුණු බව, යහපත් හා අයහපත් බව දක්නා නුවණයි.

4. සිය මවට දේශනා කළ ධර්මය අසා සත්හැවිරිදි වියේ දී ම උතුම් රහත් ඵලයට පත් වූයේ,
   - (1) සෝපාක කුමාරයා ය.
   - (2) සුනීත කුමාරයා ය.
   - (3) යස කුමාරයා ය.
   - (4) රාහුල කුමාරයා ය.

5. සතරපද ගාථාවක් පාඩම් කර ගත නොහැකි වූ ඔබ සසුන් කිස මුදුන් පමුණුවා ගන්නේ කෙසේ දැයි කියා සහෝදර භික්ෂුව විසින් විහාරයෙන් නෙරපූයේ
   - (1) උදායි තෙරුන් ය.
   - (2) මහාපන්ථක තෙරුන් ය.
   - (3) චූලපන්ථක තෙරුන් ය.
   - (4) නන්දක තෙරුන් ය.

6. අග්‍රශ්‍රාවක මුගලන් මහරහතන් වහන්සේ විසින් සිදු කරන ලද සුවිශේෂ කාර්යයන් අතරට අයත් නොවන්නේ,
   - (1) නොමගට ගිය දේවදත්ත හිමිගේ පාක්ෂික භික්ෂූන් සුමගට ගැනීමයි.
   - (2) නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීමයි.
   - (3) දෙව්ලොව හා නිරයෙහි සැරිසරමින් එහි තතු මහජනයාට පැහැදිලි කිරීමයි.
   - (4) ඉතා ගැඹුරු දහම් කරුණු සරලව මහජනයාට දේශනා කිරීමයි.

7. ප්‍රඥාවන්ත භික්ෂුණීන් අතර සම්බුද්ධ ශාසනයේ අග්‍රස්ථානයට පත් මහාශ්‍රාවිකාවන් වහන්සේ,
   - (1) උප්පලවණ්ණා තෙරණියයි.
   - (2) ඛේමා තෙරණියයි.
   - (3) භද්දකච්චානා තෙරණියයි.
   - (4) පටාචාරා තෙරණියයි.

8. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ට මෙරට උපසම්පදාව නැවත ඇති කිරීමේ මෙහෙවර සම්පූර්ණ කිරීමෙහිලා රාජ්‍ය අනුග්‍රහය ලබා දුන්නේ,

(1) වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ය.
(2) ශ්‍රී විජය රාජසිංහ රජතුමා ය.
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය.
(4) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය.

9. "සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො" යන ගාථාව විවරණය කරමින් අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ මාහිමියන් විසින් රචිත ධර්ම ග්‍රන්ථය වන්නේ,

(1) විමුක්තිමාර්ගයයි. (2) විසුද්ධිමාර්ගයයි. (3) සංඝාවිතරණියයි. (4) සුමංගලවිලාසිනියයි.

10. උපසම්පදා භික්ෂූන් පිළිබඳ විනය ශික්ෂාවන්හි පාරාජිකා ශික්ෂා අතර එන මෛථුනධම්ම පාරාජිකාපත්තියේ "සික්ඛං අපච්චක්ඛාය" ලෙස දක්වා ඇත්තේ,

(1) ශික්ෂාව නොපිළිගැනීමයි.
(2) ශික්ෂාව වෙනස් නොකිරීමයි.
(3) ශික්ෂාව ප්‍රතික්ෂේප නොකිරීමයි.
(4) ශික්ෂාව අත නොහැරීමයි.

11. භික්ෂු ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන්හි එන තෙළෙස් සංඝාදිසේස ආපත්ති, ගරුකාපත්ති ලෙස සැලකේ. ඒවා එසේ හැඳින්වෙන්නේ,

(1) දේශනා පාරිශුද්ධියෙන් පිරිසිදු වියහැකි බැවිනි.
(2) වත්සමාදානය ආදී පිළිවෙත් මාලාවකින් පිරිසිදු විය හැකි බැවිනි.
(3) උපසම්පදාව සම්පූර්ණයෙන් නැති වී යන බැවිනි.
(4) නැවත පිරිසිදු බවට පත්විය නොහැකි බැවිනි.

12. පැවිද්ද, උපසම්පදාව, පොහොය කිරීම, වස් විසීම, පවාරණය ආදී කරුණු පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ පැනවීම් ඇතුළත් වන්නේ,

(1) මහාවග්ගපාළියේ ය.
(2) චූල්ලවග්ගපාළියේ ය.
(3) පාරාජිකපාළියේ ය.
(4) පරිවාරපාළියේ ය.

13. දීඝනිකායේ සිගාලක සූත්‍රයේ ඇතුළත් ලාමක ධර්ම ගණනින්,

(1) සතළොසකි. (2) සොළසකි. (3) තුදුසකි. (4) දොළසකි.

14. කටයුතු අඩාල වීමෙන් ධනය විනාශවීම් ආදියෙන් ජීවන ගමන ප්‍රමාද කරන සූදු ක්‍රීඩාවෙහි ආදීනව සිගාලක සූත්‍රයේ දක්වා ඇත. එහි "ජිතො වෙරං පසවති" යනුවෙන් දක්වන්නේ,

(1) දිනුකල්හි පැරදුණු අයගේ වෛරය ඇති වන බවයි.
(2) පැරදුණු කල්හි ධනය පිළිබඳ ශෝකය ඇති වන බවයි.
(3) භිතමිතුරන් අතර පිරිහුණු කෙනෙකු වන බවයි.
(4) තමා බලා සිටියදීම ධනය විනාශ වන බවයි.

15. 'නිද්දාසීලී', 'සභාසීලී', 'අනුට්ඨාතා', 'අලසො' යන පදයන්හි අර්ථ අනුපිළිවෙළට නිවැරදිව පෙළගස්වා ඇති වරණය තෝරන්න.

(1) නිතර සභා කරන සුලු බව, උත්සාහයක් නැතිකම, අලස බව, නිතර නිදන සුලු බව
(2) නිතර නිදන සුලු බව, උත්සාහයක් නැතිකම, අලස බව, නිතර සභා කරන සුලු බව
(3) අලස බව, උත්සාහයක් නැතිකම, නිතර නිදන සුලු බව, නිතර සභා කරන සුලු බව
(4) නිතර නිදන සුලු බව, නිතර සභා කරන සුලු බව, උත්සාහයක් නැතිකම, අලස බව

16. යමක් පිළිගැනීමට එසැණ පදනම් නොවිය යුතු කරුණු දහයක් කාලාම සූත්‍රයේ දැක්වේ. එහි "මා භව්‍යරූපතාය" යනුවෙන් දැක්වෙන්නේ

(1) දහම් පොතපතට ගැළපේ යැයි නොපිළිගත යුතු බවයි.
(2) මෙය මෙසේ විය හැකිය කියා නොපිළිගත යුතු බවයි.
(3) න්‍යාය ධර්මයට ගැළපේ යැයි නොපිළිගත යුතු බවයි.
(4) පිළිගත් දෘෂ්ටියට ගැළපේ යැයි නොපිළිගත යුතු බවයි.

17. අභිධර්මයේ 'රූප' විභාගයේ දී අට්ඨවිසිරූප පොදුවේ ලක්ෂණ අටකින් සමන්විත බව දක්වා තිබේ. ඉන් 'අහේතුක' ලෙස දක්වා ඇත්තේ,

(1) ලෝභමූල හා අලෝභමූලයන්හි යෙදීමක් නැති බැවිනි.
(2) කර්ම, චිත්ත, ඍතු, ආහාර ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා බැවිනි.
(3) චිත්ත චෛතසික මෙන් අරමුණු ගැනීමක් නැති බැවිනි.
(4) රූප අරමුණුකොට ක්ලේශ හටගන්නා බැවිනි.

18. අභිධර්මයේ රූප විභාගයේ දී 'ලක්ඛණ රූප' නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
(1) කම්ම, චිත්ත, උතු, ආහාර
(2) පඨවි, ආපෝ, තේජෝ, වායෝ
(3) උපචය, සන්තති, ජරතා, අනිච්චතා
(4) රූප, සද්ද, ගන්ධ, රස

19. සියලු කෙලෙසුන් නසා මහරහත් බවට පත්වූ උතුමන් වහන්සේගේ රහත්බව හැඳින්වීමේ දී 'ඛීණං පුරාණං' යනුවෙන් දක්වන්නේ,
(1) නැවත ඉපදීමේ ඇල්මක් නැති බවයි.
(2) නැවත කර්ම රැස් කිරීමක් නැති බවයි.
(3) ඉපදීමේ කෙලෙස් බීජ නැති කළ බවයි.
(4) නැවත ඉපදීමට හේතු වන පැරණි කර්ම අවසන් කළ බවයි.

20. බුදුරජාණන් වහන්සේ ආයුවඩ්ඪන කුමාරයා දීර්ඝායුෂ ලැබීම අරමුණු කොට දේශනා කළ ගාථාවෙහි මුල් ගාථා අර්ධය වන්නේ,
(1) යො ච වස්සසතං ජීවෙ - දුස්සීලො අසමාහිතො
(2) අභිවාදනසීලිස්ස - නිච්චං වද්ධාපචායිනො
(3) මාසෙ මාසෙ සහස්සෙන - යො යජේථ සතං සමං
(4) යො ච වස්සසතං ජන්තු - අග්ගිං පරිචරෙ වනෙ

21. බුදුරජාණන් වහන්සේ බහුපුත්තිකා තෙරණින් වහන්සේ අරමුණුකොට දේශනා කළ "යො ච වස්සසතං ජීවෙ - අපස්සං ධම්මමුත්තමං" යන ගාථාවේ ධම්මමුත්තමං යන්නෙන් අදහස් කරන්නේ,
(1) නවලෝකෝත්තර ශ්‍රී සද්ධර්මයයි.
(2) නවාංගශාස්තෘ ශාසනයයි.
(3) සූත්‍ර පිටකයට අයත් ධර්මයයි.
(4) ධර්මරත්නයේ උතුම් ගුණ හයයි.

22. ධම්මපදයේ පාප වග්ගයේ හමුවන "අභිත්ථරෙථ කල්‍යාණෙ පාපා චිත්තං නිවාරයෙ" යන ගාථාව දේශනා කොට වදාළේ,
(1) සෙය්‍යසක තෙරුන් වහන්සේට ය.
(2) ලාජා දෙවඟනට ය.
(3) ඒකසාටක බමුණාට ය.
(4) අනේපිඬු මහ සිටුතුමාට ය.

23. විපස්සනා හෙවත් ප්‍රඥා භාවනාවෙන් ලබාගත හැකි ලෞකික ප්‍රතිඵලයක් නොවන්නේ,
(1) ජරාවට පත්වීම ස්වාභාවික බව අවබෝධ කරගත හැකි වීමයි.
(2) භෞතික සම්පත් නිරන්තර විපරිණාමයට පත්වන බව අවබෝධ වීමයි.
(3) ජීවිතය සැමදා සිතන පතන අයුරින් නොපවතින බව අවබෝධ වීමයි.
(4) ධ්‍යාන සමාපත්ති මෙලොවදීම ලබාගත හැකි වීමයි.

24. හේතුඵල දහම් ගස්වැල් සහිත ලෝකයෙහි ද, මිනිස් මනසෙහි ද එකසේ ක්‍රියාත්මක වේ. 'නියාම ධර්ම' පසක් ලෙස බුදුදහමේ සඳහන් වන්නේ ලෝකයේ ක්‍රියාත්මක මෙම ස්වභාවයයි. එම නියාම ධර්ම අතර ධම්ම නියාම ලෙස දක්වා ඇත්තේ,
(1) ලෝකයේ ස්වාභාවික වෙනස්කම් හේතුඵල අනුරූපව සිදුවීමයි.
(2) සිතෙහි ක්‍රියාකාරීත්වය හේතුඵල අනුරූපව සිදුවීමයි.
(3) හොඳ නරක කර්මයන්හි විපාක හේතුඵල අනුරූපව සිදුවීමයි.
(4) කාලගුණික වෙනස්කම් හේතුඵල අනුරූපව සිදුවීමයි.

25. ජනක කර්මයෙන් උපන් තැනැත්තාගේ කුසලාකුසල කර්ම විපාක ගෙනදීම සඳහා උපකාර කරන්නේ,
(1) උපපීළක කර්මයයි.
(2) උපඝාතක කර්මයයි.
(3) උපත්ථම්භක කර්මයයි.
(4) උපපජ්ජවේදනීය කර්මයයි.

26. කර්මය විපාක දෙන ආකාරය අනුව සතරාකාරයක් දැක්වේ. එහි අනුපිළිවෙළ දක්වා ඇති වරණය මින් කුමක් ද?
(1) ගරුක කර්ම, ආචිණ්ණ කර්ම, ආසන්න කර්ම, කටත්තා කර්ම
(2) ගරුක කර්ම, ආසන්න කර්ම, ආචිණ්ණ කර්ම, කටත්තා කර්ම
(3) ආචිණ්ණ කර්ම, ගරුක කර්ම, ආසන්න කර්ම, කටත්තා කර්ම
(4) ආසන්න කර්ම, ආචිණ්ණ කර්ම, ගරුක කර්ම, කටත්තා කර්ම

27. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ 'සම්මා කම්මන්ත' තුළින් පැහැදිලි වන්නේ,
(1) මිථ්‍යා සංකල්පයෙන් බැහැර වී නිවැරදි කල්පනාවෙන් යුක්ත වීමයි.
(2) වැරදි ක්‍රියාවෙන් බැහැර වී නිවැරදි කාය කර්මයෙන් යුක්ත වීමයි.
(3) වැරදි දිවි පැවැත්මෙන් බැහැර වී ධාර්මික ජීවනෝපායෙන් යුක්ත වීමයි.
(4) වැරදි දෘෂ්ටියෙන් බැහැර වී නිවැරදි දර්ශනයෙන් යුක්ත වීමයි.

28. සංඝමිත්තා රහත් තෙරණින් වහන්සේ ලක්දිවට වැඩමවීමේ ප්‍රමුඛතම අරමුණ වූයේ,
   (1) ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමවීමයි.
   (2) ශිල්ප ශ්‍රේණි දහඅටක පිරිස රැගෙන ඒමයි.
   (3) භික්ෂුණීන් වහන්සේලා පිරිසක් දඹදිවින් වැඩමවීමයි.
   (4) භික්ෂුණී ශාසනය පිහිටුවීමට මූලිකත්වය ගැනීමයි.

29. ධාර්මික රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් වන 'දස සක්විතිවත්' පිළිබඳ සඳහන් වන්නේ,
   (1) දීඝනිකායේ සිගාලක සූත්‍රයේ ය. (2) දීඝනිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයේ ය.
   (3) දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය. (4) දීඝනිකායේ කූටදන්ත සූත්‍රයේ ය.

30. බුදුරජාණන් වහන්සේ දතයුතු සියලු ධර්මය වැරදීමකින් තොරව පරෝපදේශ රහිතව තමන් වහන්සේ විසින් ම අවබෝධ කොට වදාළ හෙයින්
   (1) අරහං නම් වන සේක. (2) විජ්ජාචරණ නම් වන සේක.
   (3) සුගත නම් වන සේක. (4) සම්මාසම්බුද්ධ නම් වන සේක.

31. ආර්ය සංඝරත්නයේ ගුණ ප්‍රකාශ වන පාඨයෙහි 'ඤායපටිපන්න' ලෙස දක්වා ඇත්තේ,
   (1) නිර්වාණාවබෝධය සඳහා වන ආර්ය ප්‍රතිපදාවට පිළිපන් බැවිනි.
   (2) පරලොව සුව පතා දෙන පූජාවන් පිළිගැනීමට සුදුසු වන බැවිනි.
   (3) සම්මා දිට්ඨි ආදී යහපත් ප්‍රතිපදාවන්ට පිළිපන් බැවිනි.
   (4) වැඳුම් පිදුම් ගරු සැලකිලි ලැබීමට සුදුසු වන බැවිනි.

32. ආසවට්ඨානීය ධර්ම පහළවීමත් සමඟ භික්ෂු ශාසනයේ විනය නීති පැනවීමේ අවශ්‍යතාව මතු විය. ආසවට්ඨානීය ධර්ම අතර "වෙපුල්ල මහත්තතා" යන්නෙන් අදහස් වන්නේ,
   (1) ලාභ ප්‍රයෝජන බහුල වීමයි. (2) බහුශ්‍රැතයන් බහුල වීමයි.
   (3) සංඝයා පිරිස වශයෙන් බහුල වීමයි. (4) පැවිදි වී කාලයක් ගත වූ භික්ෂූන් බහුල වීමයි.

33. උපසපන් භික්ෂුවක විසින් මැනවින් ආරක්ෂා කළ යුතු ශික්ෂා අතර 'අකරණීය ධර්ම' ලෙස දක්වා ඇත්තේ,
   (1) තෙළෙස් සංඝාදිසේසයන් ය. (2) සතර පාරාජිකාවන් ය.
   (3) අනියත ධර්ම දෙක ය. (4) පාචිත්තිය ධර්ම සිහ ය.

34. "කිසිවක් නිත්‍ය යැයි ප්‍රකාශ කිරීමට හැකියාවක් නැත." සංස්කාර ධර්ම අතර කියවෙන මෙම ස්වභාවය,
   (1) අනිත්‍යතාවයි. (2) දුක්ඛතාවයි. (3) අනත්තතාවයි. (4) විපරිණාමයයි.

35. සත්ත්වයා සසරට බැඳ තැබීම සංයෝජන ධර්මයන්ගේ ස්වභාවයයි. එම සංයෝජනයන්ගෙන් මිදීමෙන් සසර දුකින් අත්මිදිය හැකි ය. සංයෝජන ධර්ම අතර සිත එක් අරමුණක තබාගත නොහැකි ස්වභාවය,
   (1) අවිජ්ජා නම් වේ. (2) කාමරාග නම් වේ. (3) උද්ධච්ච නම් වේ. (4) පටිඝ නම් වේ.

36. දෙවැනි ධර්ම සංගායනාව පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් වරණය තෝරන්න.
   (1) ධර්මාශෝක රජු, මොග්ගලිපුත්තතිස්ස තෙරුන්, කථාවත්ථුප්පකරණය
   (2) අජාසත්ත රජු, රජගහ නුවර, පංචසතිකා
   (3) කණිෂ්ක රජු, කුණ්ඩලවන විහාරය, මහා විභාෂා
   (4) කාලාශෝක රජු, දස අකැප වස්තු, යස තෙරුන්

37. දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ දැක්වෙන ආකාරයට සියලු යහපත් ක්‍රියාවන්ගේ හෝ අයහපත් ක්‍රියාවන්ගේ පිනක් හෝ පවක් නැතැයි පවසමින් අකිරියවාදයක් ප්‍රකට කළ ශාස්තෘවරයා
   (1) මක්ඛලිගෝසාල ය. (2) පූරණකස්සප ය.
   (3) පකුධකච්චායන ය. (4) නිගණ්ඨනාතපුත්ත ය.

38. සම්බුද්ධ ශාසනයට සුවිසල් මෙහෙවරක් කළ ධර්මාශෝක මහ අධිරාජයා බිහි වූ මෞර්ය රාජවංශයේ ආරම්භක මහා නරේන්ද්‍රයා වූයේ,
   (1) චන්ද්‍රගුප්ත රජු ය. (2) සමුද්‍රගුප්ත රජු ය. (3) බින්දුසාර රජු ය. (4) ධනානන්ද රජු ය.

39. පටිච්චසමුප්පාද සිද්ධාන්තයට අයත් අංග අතර ඉන්ද්‍රිය, අරමුණු හා විඥානය එකට එක්වීම හඳුන්වා ඇත්තේ,
   (1) අවිජ්ජා ලෙස ය. (2) සළායතන ලෙස ය. (3) ඵස්ස ලෙස ය. (4) උපාදාන ලෙස ය.

40. අනුන්ගේ සම්පත්තිය දකින්නා වූ ද, අසන්නා වූ ද සත්පුරුෂයන්ගේ සිත්හි ඇතිවන්නා වූ සතුටුසහගත ස්වභාවය
   (1) කරුණා ගුණයයි. (2) මුදිතා ගුණයයි. (3) මෙත්තා ගුණයයි. (4) උපේක්ෂා ගුණයයි.

* * *


## 2.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 2 | 21. | 1 |
| 02. | 4 | 22. | 3 |
| 03. | 3 | 23. | 4 |
| 04. | 1 | 24. | 1 |
| 05. | 3 | 25. | 3 |
| 06. | 4 | 26. | 2 |
| 07. | 2 | 27. | 2 |
| 08. | 3 | 28. | 4 |
| 09. | 2 | 29. | 3 |
| 10. | 3 | 30. | 4 |
| 11. | 2 | 31. | 1 |
| 12. | 1 | 32. | 3 |
| 13. | 3 | 33. | 2 |
| 14. | 2 | 34. | 1 |
| 15. | 4 | 35. | 3 |
| 16. | 2 | 36. | 4 |
| 17. | 1 | 37. | 2 |
| 18. | 3 | 38. | 1 |
| 19. | 4 | 39. | 3 |
| 20. | 2 | 40. | 2 |

වගුව 2.1

**නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.**

## 2.4 I ප්‍රශ්න පත්‍රයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණය




ප්‍රස්තාරය 2.1

(RD/16/5/MPF ෆෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත. අපේක්ෂකයන් වැඩි ම සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා ඇති 1 ප්‍රශ්නයේ පහසුතා දර්ශකය 0.89කි. එනම් 1 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 89%ක් නිවැරදි පිළිතුර සපයා ඇත. ඒ අනුව ප්‍රශ්නයේ පහසුතාව 89%ක් ලෙස දැක්විය හැකි ය.

## 2.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | Missing |
| 1 | 2 | 6.53 | 88.67 | 1.32 | 2.32 | 1.16 |
| 2 | 4 | 15.88 | 21.17 | 17.12 | 42.85 | 2.98 |
| 3 | 3 | 20.68 | 17.54 | 49.63 | 10.34 | 1.74 |
| 4 | 1 | 32.51 | 11.17 | 35.65 | 18.94 | 1.74 |
| 5 | 3 | 3.8 | 13.98 | 78.66 | 2.48 | 1.08 |
| 6 | 4 | 14.31 | 19.77 | 12.41 | 52.27 | 1.24 |
| 7 | 2 | 21.34 | 65.67 | 5.62 | 6.04 | 1.32 |
| 8 | 3 | 13.73 | 6.78 | 58.06 | 20.02 | 1.41 |
| 9 | 2 | 7.78 | 71.05 | 6.37 | 13.65 | 1.16 |
| 10 | 3 | 20.84 | 7.61 | 55.75 | 14.39 | 1.41 |
| 11 | 2 | 26.8 | 44.75 | 14.97 | 12.08 | 1.41 |
| 12 | 1 | 34.57 | 18.78 | 30.93 | 14.56 | 1.16 |
| 13 | 3 | 11.5 | 25.31 | 36.81 | 24.81 | 1.57 |
| 14 | 2 | 30.77 | 46.24 | 6.62 | 14.72 | 1.65 |
| 15 | 4 | 5.21 | 7.78 | 4.3 | 82.05 | 0.66 |
| 16 | 2 | 11.08 | 56.33 | 13.32 | 18.28 | 0.99 |
| 17 | 1 | 23.99 | 18.94 | 34.41 | 21.34 | 1.32 |
| 18 | 3 | 12.16 | 16.79 | 49.96 | 20.02 | 1.08 |
| 19 | 4 | 18.86 | 12.41 | 17.45 | 50.54 | 0.74 |
| 20 | 2 | 8.93 | 75.6 | 7.86 | 6.29 | 1.32 |
| 21 | 1 | 35.07 | 10.59 | 5.79 | 46.98 | 1.57 |
| 22 | 3 | 32.75 | 23.16 | 31.43 | 10.59 | 2.07 |
| 23 | 4 | 12.41 | 18.53 | 17.95 | 50.12 | 0.99 |
| 24 | 1 | 42.51 | 13.73 | 34.74 | 7.86 | 1.16 |
| 25 | 3 | 16.46 | 18.03 | 34.9 | 28.87 | 1.74 |
| 26 | 2 | 37.06 | 36.48 | 10.92 | 14.56 | 0.99 |
| 27 | 2 | 24.98 | 46.48 | 22.33 | 4.71 | 1.49 |
| 28 | 4 | 50.54 | 2.65 | 2.48 | 42.93 | 1.41 |
| 29 | 3 | 10.59 | 13.56 | 61.79 | 13.23 | 0.83 |
| 30 | 4 | 12.16 | 11.91 | 8.52 | 65.67 | 1.74 |
| 31 | 1 | 53.1 | 13.73 | 17.37 | 14.47 | 1.32 |
| 32 | 3 | 22.83 | 23.9 | 28.21 | 23.16 | 1.9 |
| 33 | 2 | 12.99 | 61.46 | 17.7 | 6.12 | 1.65 |
| 34 | 1 | 82.3 | 5.46 | 4.47 | 6.53 | 1.24 |
| 35 | 3 | 15.63 | 39.87 | 23.33 | 19.77 | 1.41 |
| 36 | 4 | 16.13 | 10.01 | 6.12 | 66.34 | 1.41 |
| 37 | 2 | 33.17 | 32.42 | 14.64 | 18.44 | 1.32 |
| 38 | 1 | 79.82 | 5.87 | 10.01 | 3.23 | 0.99 |
| 39 | 3 | 14.47 | 34.33 | 18.78 | 30.27 | 2.15 |
| 40 | 2 | 19.85 | 30.27 | 17.29 | 30.6 | 1.99 |

වගුව 2.2

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත. Missing තීරයේ දක්වා ඇත්තේ කිසිදු වරණයක් තෝරා නොගත් හෝ එක් වරණයකට වඩා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතයයි.

## 2.6 තේමා අනුව I ප්‍රශ්න පත්‍රයේ තේමා අනුව ප්‍රශ්න ඉදිරිපත් කර ඇති ආකාරය හා විශ්ලේෂණය

ත්‍රිපිටක ධර්මය විෂයයෙහි 1ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න 40 ක් ඇතුළත් වන අතර ඒ ඒ තේමා අනුව එම ප්‍රශ්න 40 සකස් වී ඇති ආකාරය පහත වගුවේ සඳහන් කර ඇත.

| **තේමාව/ විෂය ක්ෂේත්‍රය** | **ප්‍රශ්න අංකය** |
|---|---|
| බුද්ධ චරිතය | 01, 02, 03, 04, 05, 30, 31 |
| චරිත කතා | 06, 07, 08, 09, 38 |
| සූත්‍ර ධර්ම | 13, 14, 15, 16, 37 |
| විනය | 10, 11, 12, 32, 33 |
| අභිධර්මය | 17, 18 |
| ධම්මපදය | 20, 21, 22 |
| භාවනා | 23 |
| ධර්මය(දහම් කරුණු) | 19, 24, 25, 26, 27, 34, 35,39, 40 |
| ශාසන ඉතිහාසය | 28, 29, 36 |


වගුව 2.3

ප්‍රශ්න 40න් ප්‍රශ්න 09ක් ධර්මය තේමාව යටතේ ද ප්‍රශ්න 07ක් බුද්ධ චරිතය තේමාව යටතේ ද ඉදිරිපත් කර ඇත. 'භාවනා' තේමාව යටතේ එක් ප්‍රශ්නයක් පමණක් ඉදිරිපත් කර ඇත.

**ඒ ඒ තේමාව යටතේ පහසුතාව වැඩි ම සහ අඩු ම ප්‍රශ්න අංක හා පහසුතා පහත වගුවේ දැක්වේ**

| **තේමාව** | **පහසුතාව වැඩිම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව** | **පහසුතාව අඩුම ප්‍රශ්න අංකය හා එහි පහසුතාව** |
|---|---|---|
| බුද්ධ චරිතය | 1 - (89%) | 4 - (33%) |
| චරිත කතා | 38 - (80%) | 6 - (52%) |
| සූත්‍ර ධර්ම | 15 - (82%) | 37 - (32%) |
| විනය | 33 - (61%) | 32 - (28%) |
| අභිධර්මය | 18 - (50%) | 17 - (24%) |
| ධම්මපදය | 20 - (76%) | 22 - (31%) |
| ධර්මය (දහම් කරුණු) | 34 - (82%) | 39 - (19%) |

වගුව 2.4





පුස්තාරය 2.2
(RD/16/5/MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදී)

I ප්‍රශ්න පත්‍රයේ වැඩි ම ප්‍රශ්න සංඛ්‍යාවක් ධර්මය තේමාව යටතේ ඉදිරිපත් කර තිබූ අතර සමස්ත I ප්‍රශ්න පත්‍රයේ පහසුතාව අඩු ම ප්‍රශ්නය ද මෙම තේමාව යටතේ ඉදිරිපත් වී ඇත. 39 ප්‍රශ්නය I පත්‍රයේ පහසුතාව අඩු ම ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 19%කි.

බුද්ධ චරිතය තේමාව යටතේ දෙවනුවට වැඩි ප්‍රශ්න ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇති අතර සමස්ත I ප්‍රශ්න පත්‍රයේ පහසුතාව වැඩිම ප්‍රශ්නය ද මෙම තේමාව යටතේ ම ඉදිරිපත් වී ඇත. පළමු ප්‍රශ්නය පහසුතාව වැඩිම ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 89%කි.

එක් ප්‍රශ්නයක් පමණක් භාවනා තේමාව ඉදිරිපත් වී ඇති අතර එම ප්‍රශ්නයෙහි පහසුතාව 50%කි.




ප්‍රස්තාරය 2.3

ත්‍රිපිටක ධර්මය I පත්‍රය සැකසීමේ දී පදනම් කරගත් තේමා 9 අතුරෙන් එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතාව සලකා එක් එක් තේමාවෙහි මධ්‍යක පහසුතාව හා එම තේමාව යටතේ ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රමාණය මෙම ප්‍රස්තාරයෙන් නිරූපණය කර ඇත.
චරිත කතා තේමාව යටතේ 13%ක පමණ ප්‍රශ්න ප්‍රතිශතයක් ඉදිරිපත් වී තිබූ අතර එම තේමාවෙහි පහසුතාව 65%කි. එය මෙම තේමා 9 අතුරෙන් මධ්‍යක පහසුතාව වැඩි ම තේමාව වේ.
අභිධර්මය තේමාව මෙම තේමා 9 අතුරෙන් මධ්‍යක පහසුතාව අඩු ම තේමාව වන අතර එහි මධ්‍යක පහසුතාව 37%කි. එම තේමාව යටතේ ඉදිරිපත් වී තිබූ ප්‍රශ්න ප්‍රමාණය සමස්ත I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න ප්‍රමාණයෙන් 5%ක් පමණි.

## 2.7 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 අතුරෙන් පහසුතාව 30%ක් හෝ එය ඉක්ම වූ ප්‍රශ්න සංඛ්‍යාව 36කි. 30%ට වඩා අඩු පහසුතාවක් ඇති ප්‍රශ්න සංඛ්‍යාව 04කි. මෙම ප්‍රශ්න පත්‍රයේ අපේක්ෂකයන් වැඩි ම ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 1 ප්‍රශ්නයටයි. එහි පහසුතාව 89%කි. එමෙන්ම අපේක්ෂකයන් අඩු ම ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 39 ප්‍රශ්නයට වන අතර එහි පහසුතාව 18.78%කි.

ප්‍රශ්න පත්‍රයේ වැඩි ම පහසුතාව ඇති අංක 01 ප්‍රශ්නය බුද්ධ චරිතය ඇසුරෙන් සකස් කර ඇත.එම ප්‍රශ්නයෙන් අපේක්ෂකයන් නිරන්තරයෙන් සාකච්ඡාවන සරල දහම් කරුණක් පිළිබඳ විමසා තිබීම මෙයට හේතුවක් විය හැකි ය.

4 ප්‍රශ්නය බුදුරදුන්ගේ පිහිට ලද්දෝ තේමාවෙන් බුද්ධ චරිතය ආශ්‍රයෙන් විමසා ඇත. මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වූ 1 වරණය 32.51%ක් තෝරා ඇති නමුත් 3 වරණය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 35.65%ක් පමණ වේ. 1 වරණය හා 3 වරණය දෙක ම සමාන සිද්ධි පදනම් කරගෙන සැකසී ඇති අතර එම සිද්ධි දෙක පැහැදිලිව වෙන් වෙන් වශයෙන් මතක තබා නොගැනීම නිසා වැඩි අපේක්ෂකයන් පිරිසක් 3 වරණය නිවැරදි වරණය ලෙස තෝරා ගැනීමට පෙළඹී ඇති බව සිතිය හැකි ය.

17 ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ අභිධර්මයේ රූප විභාගය පිළිබඳවයි. නිවැරදි පිළිතුර වූ 1 වරණය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 23.99%කි. නමුත් 3 වරණය අපේක්ෂකයන් 34.41% තෝරාගෙන ඇත. අභිධර්මයේ මූලික කරුණු පිළිබඳ නිරවුල් අවබෝධයක් හා මතකයක් නොමැති වීම මෙයට හේතු විය හැකි ය. අභිධර්මය වැනි විෂය කොටස් ඉගැන්වීමේ දී කරුණු පහසුවෙන් ධාරණය කරගත හැකි කෙටි ක්‍රම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කිරීම මගින් මෙම විෂය කරුණු සම්බන්ධ ප්‍රශ්නවලට අපේක්ෂකයන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

21 ප්‍රශ්නය ධම්මපදය ආශ්‍රයෙන් සකස් කර ඇති අතර නිවැරදි වරණය වූ 1 වරණය තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 35.07%කි. නමුත් 4 වරණය නිවැරදි පිළිතුර ලෙස 46.98% ක් තෝරා ගෙන ඇත. එම ප්‍රශ්නයෙන් පාලි ගාථාවෙහි 'ධම්මමුත්තමං' යන පදයේ අදහස විමසා ඇති නමුත් අපේක්ෂකයන් විසින් 'ධම්මමුත්තමං' යන පදයෙහි වචනාර්ථය පමණක් සලකා නිවැරදි වරණය ලෙස ධර්මරත්නයේ උතුම් ගුණ ලෙස වරදවා වටහා ගෙන පිළිතුර තෝරා ඇති බව සිතිය හැකි ය.

22 ප්‍රශ්නය ද ධම්මපදය ඇසුරින් සකසා ඇත. එහි නිවැරදි වරණය වූ 4 වරණය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 31.43%කි. එහෙත් 1 වරණය නිවැරදි වරණය ලෙස තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 32.75%කි. ධම්මපදයේ ගාථාවල අර්ථයත්, නිදාන කථාවත් පැහැදිලිව පෙළපොතේ දක්වා ඇතත් නිදාන කතාව හා ගාථාව අතර සම්බන්ධය නිවැරදිව වටහා නොගැනීමත් මතකයේ තබා නොගැනීමත් මෙයට හේතු විය හැකි ය. එවැනි විෂය කරුණු මතක තබා ගත හැකි ආකාරයට ඉගැන්වීමේ කටයුතු සිදුකිරීමෙන් අපේක්ෂකයන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

28 ප්‍රශ්නය ශාසන ඉතිහාසය ඇසුරින් සකස් කර ඇති අතර නිවැරදි වරණය වූ 4 වරණය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 42.93%කි. නමුත් 1 වරණය නිවැරදි වරණය ලෙස 50.54%ක අපේක්ෂකයන් පිරිසක් තෝරාගෙන ඇත. නිරන්තරයෙන් අසා ඇති සරල දහම් කරුණක් වුවත් 'ප්‍රමුඛතම' යන පදයට නිසි අවධානය යොමු නොකිරීම මෙයට හේතුවක් ලෙස සිතිය හැකි ය.

32 ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ ආසවට්ඨානීය ධර්ම පිළිබඳවයි. නිවැරදි පිළිතුර වූ 3 වරණය තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 28.21%කි. සෙසු පිළිතුරු ද එයට ආසන්න ප්‍රතිශතයකින් තෝරාගෙන ඇත. ඉතා සරල දහම් කරුණක් වුවත් නිවැරදි ලෙස මතක තබා නොගැනීම මෙම තත්වයට හේතුවක් විය හැකි ය.

35 ප්‍රශ්නය දස සංයෝජන පිළිබඳ විමසා ඇත. නිවැරදි පිළිතුර වූ 3 වරණය තෝරා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 23.33%කි. නමුත් 2 වරණය නිවැරදි පිළිතුර ලෙස තෝරාගෙන ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 39.87%කි. ප්‍රශ්නය නිවැරදි අවබෝධයෙන් නොකියවා "සත්වයා සසරට" බැඳ තැබීම යන කොටසට වැඩි අවධානයක් යොමු කිරීමෙන් කාමරාග යන පිළිතුර තෝරා ගෙන ඇති බව සිතිය හැකි ය. ප්‍රශ්නය හා පිළිතුරු සම්පූර්ණයෙන් කියවා නිවැරදි පිළිතුර ලකුණු කිරීමට පුහුණු කිරීම තුළින් සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

39 ප්‍රශ්නය විමසා ඇත්තේ පටිච්ච සමුප්පාදය ඇසුරෙනි. එහි නිවැරදි පිළිතුර වූ 3 වරණය තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රමාණය 18.78%කි. පටිච්ච සමුප්පාදයේ අංග සහ අර්ථ පිළිබඳ ව නිරවුල් අවබෝධයක් නොමැතිවීම මෙයට හේතු වී තිබිය හැකි ය.

# II ප්‍රශ්න පත්‍රයේ විශ්ලේෂණය

## 3 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 3.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**II පත්‍රය - කාලය : පැය 03යි**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය. ප්‍රශ්න හතකින් ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය

I කොටස - **පළමුවන** ප්‍රශ්නය අනිවාර්යය වේ. කෙටි පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 10 කින් සමන්විත ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20 කි.

II කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **තුනකින්** සමන්විත වන අතර ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ ප්‍රශ්නවලින් බුද්ධ චරිතය, චරිත කතා, ශාසන ඉතිහාසය, විනය යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු 20කි.


III කොටස - ව්‍යුහගත රචනා ප්‍රශ්න **තුනකින්** සමන්විත වන අතර ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. මෙම කොටසේ ප්‍රශ්නවලින් සූත්‍ර, භාවනා, අභිධර්මය, ධම්ම පදය හා මූලික ඉගැන්වීම් යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය කෙරේ.
එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලකුණු 20 කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු $= 20 + 20 + 20 = 60$

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 40 |
| II පත්‍රය | = | 60 |
| අවසාන ලකුණ | = | 100 |


## 3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 3.1
(RD/ 16 / 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

- II ප්‍රශ්න පත්‍රයේ පළමු ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. එබැවින් අපේක්ෂකයන් 98.9%ක් එම ප්‍රශ්නය තෝරාගෙන ඇත.
- II ප්‍රශ්න පත්‍රයේ II කොටසට ප්‍රශ්න තුනක් ඇතුළත් වන අතර එයින් දෙවන ප්‍රශ්නය බුද්ධ චරිතය ඇසුරෙන් ද තුන්වන ප්‍රශ්නය ශ්‍රාවක චරිත ඇසුරෙන් ද හතරවන ප්‍රශ්නය විනය කොටස් ඇසුරෙන් ද සකස් කර ඇත.
- II ප්‍රශ්න පත්‍රයේ III කොටසට ද ප්‍රශ්න තුනක් ඇතුළත් වන අතර එයින් පස්වන ප්‍රශ්නය ධම්මපදය ඇසුරෙන්ද හයවන ප්‍රශ්නය කර්ම සංකල්පය ඇසුරෙන් ද හත්වන ප්‍රශ්නය අභිධර්මය ඇසුරෙන් ද සකස් කර ඇත.
- බුද්ධ චරිතය ඇසුරෙන් සකස් කර ඇති දෙවන ප්‍රශ්නය අපේක්ෂකයන් 85.27%ක් තෝරාගෙන ඇත. බුද්ධ චරිතය කතාවක ස්වරූපයෙන් මතකයේ රැඳෙන බැවින් ඉතා පහසුවෙන් ලකුණු ලබා ගත හැකි වීම නිසා එම ප්‍රශ්නය වැඩි අපේක්ෂකයන් පිරිසක් තෝරාගෙන ඇති බව සිතිය හැකි ය.
- අඩුම අපේක්ෂයන් ප්‍රමාණයක් තෝරාගෙන ඇත්තේ විනය ඇසුරෙන් සකසා ඇති 4 ප්‍රශ්නය හා අභිධර්මය ඇසුරෙන් සකසා ඇති 7 ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී විෂයකරුණු වණපොත් කර තිබීම අත්‍යවශ්‍ය වීමත් වඩා පහසුවෙන් පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්න තෝරා ගැනීමට අවස්ථාව තිබීමත් නිසා මෙම ප්‍රශ්න අඩු ප්‍රතිශතයකින් තෝරාගැනීම සිදුවී ඇති බව සිතිය හැකි ය.
- 3 හා 5 ප්‍රශ්න 70%ට වඩා වැඩි අපේක්ෂකයන් පිරිසක් තෝරා ගෙන තිබෙන අතර 6 ප්‍රශ්නය 48% අපේක්ෂකයන් ප්‍රමාණයන් තෝරාගෙන ඇත. චරිත කතා, ධම්මපදය, සහ කර්මය යන තේමාවන්ගෙන් එම ප්‍රශ්න සැකසී ඇත. එම ප්‍රශ්න සෑම වසරක ම ප්‍රශ්න පත්‍රය සඳහා ඇතුළත් ව ඇති බැවින් අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයක් මේ ප්‍රශ්න සඳහා සූදානම් ව සිටීම මෙම ප්‍රශ්න වැඩි ප්‍රතිශතයක් තෝරා ගැනීමට හේතු වී තිබිය හැකි ය.

## 3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 3.2
**(RD / 16/ 2/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)**

මෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඒ සඳහා ලකුණු 20ක් ලබා දී ඇත. 2 සිට 7 දක්වා ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 10බැගින් ලබා දී ඇත.
මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.
1 ප්‍රශ්නයට හිමි ලකුණු 20, 0 -5, 6 - 10, 11- 15, 16 - 20 යන පන්ති ප්‍රාන්තර 4කට වෙන් කර ඇති අතර එම ප්‍රාන්තර අනුව ලකුණු ප්‍රතිශතයක් ලෙස 00 - 25%, 26 - 50% ත් 51 - 75%ත් 76 -100% යන ලකුණු පරාස හතරකට වෙන් කර ඇත. ඒ අනුව මුළු ලකුණු 20 න් ලකුණු 6 - 10 අතර ලකුණු ලබා ඇති එනම් ලකුණු 20න් 26 - 50% ත් අතර ලකුණු ලබා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 44% කි.

2 ප්‍රශ්නයට හිමි ලකුණු 10, 0 -2, 3- 5, 6- 7, 8 - 10, යන පන්ති ප්‍රාන්තර 4කට වෙන් කර ඇති අතර එම ප්‍රාන්තර අනුව ලකුණු ප්‍රතිශතයක් ලෙස 00 - 25%, 26 - 50% ත් 51 - 75%ත් 76 -100% යන ලකුණු පරාස හතරකට වෙන් කර ඇත. ඒ අනුව මුළු ලකුණු 10 න් ලකුණු 3 - 5 ත් අතර ලකුණු ලබා ඇති එනම් ලකුණු 10න් 26 - 50% ත් අතර ලකුණු ලබා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 31%කි.

එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ඉදිරි පිටුවල අන්තර්ගත වේ.

## 3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය පිළිබඳ විශ්ලේෂණය




ප්‍රස්තාරය 3.3

(RD/ 16/ 4 / MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

1 ප්‍රශ්නයේ (iv) කොටසේ පහසුතා දර්ශකය 0.70කි. එනම් 1(iv) කොටස සඳහා අපේක්ෂකයන්ගෙන් 70%ක් සාර්ථකව පිළිතුරු සපයා ඇත. ඒ අනුව එම ප්‍රශ්නයේ පහසුතාවය 70%කි.

## 3.5. II ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය හා විශ්ලේෂණය

**1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න**

**(i) ශ්‍රාවක සංඝරත්නය 'සාමීචිපටිපන්නො' යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න**

1) සංඝයා ඇප උපස්ථාන කර ගනිමින් සමගියෙන් සතුටින් පහසුවෙන් පැවිදි දිවිය ගෙවන බැවින් ද
2) ආර්ය මාර්ගය සසර දුකින් බැහැරලීමට සමත්වන බැවින් ද
3) මහසඟරුවන එම මාර්ගයට පිළිපන් බැවින් ද යනුයි

**කරුණු දෙකක් සඳහා (ලකුණු 02යි)**

**(ii) පඨම සාරාණිය සූත්‍රයෙහි සඳහන් විශේෂයෙන් පැවිද්දන් විසිනුත්, අවිශේෂයෙන් සියල්ලන් විසිනුත් සිහිකළ යුතු ධර්ම අතරින් දෙකක් පෙන්වා දෙන්න**

- සබ්‍රහ්මචාරීන් කෙරෙහි මෛත්‍රී සහගත කාය කර්මයෙන් යුක්ත විය යුතු බව
- මෛත්‍රී සහගත වාක් කර්මයෙන් යුක්ත විය යුතු බව
- මෛත්‍රී සහගත මනෝ කර්මයෙන් යුක්ත විය යුතු බව
- සිව්පසය සම්බන්ධයෙන් සබ්‍රහ්මචාරීන් සමග සාධාරණභෝගී විය යුතු බව
- සබ්‍රහ්මචාරීන් හා සමාන වූ ආර්ය ශීලයෙන් යුක්ත විය යුතු බව
- සමාන සම්‍යදෘෂ්ටිකයන් විය යුතු බව

**කරුණු දෙකක් සඳහා (ලකුණු 02යි)**

**(iii) 'උපසම්පදා' යන වචනයේ දළ අදහස ප්‍රකාශ කෙරෙන කරුණු දෙකක් ලියා දක්වන්න**

- වගකීම් සහිත නියම භික්ෂුත්වයට එළඹවීම
- සාමණේර බවින් ඔසවා තැබීම
- අධිශීලයට පත්වීම **කරුණු දෙකක් සඳහා(ලකුණු 02යි)**

**(iv) අශෝක රජතුමාගේ දේවිවරුන් අතරින් විදිසා දේවියගේ දරුවන් දෙදෙනාගේ නම් ලියන්න**

මහින්ද කුමරු හා සංඝමිත්තා කුමරිය

**(ලකුණු 02යි)**

**(v) බුද්ධකාලීන භාරතයේ විසූ ෂට් ශාස්තෘන් වහන්සේලා හැඳින්වීමට සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන් 'සංඝීචෙව ගණී ච' යන්නෙහි අර්ථ දෙක දක්වන්න**

- විශාල පැවිදි සමූහයක් ඇති
- පැවිදි ගණයා පෙරටු කොට විශාල පිරිසකට ආචාර්ය වූ යන්නයි

**(ලකුණු 02යි)**

**(vi) දුක්ඛ සංකල්පනාව ලොවට විෂය වන ආකාර තුන අතරින් දෙකක් ඉදිරිපත් කරන්න**

- දුක්ඛ දුක්ඛතා සාමාන්‍ය දුක
- විපරිණාම දුක්ඛතා වෙනස්වීම පිළිබඳ දුක
- සංඛාර දුක්ඛතා සංස්කාර පිළිබඳ දුක

**ආකාර දෙකක් සඳහා (ලකුණු 02යි)**

**(vii) බුදුරජාණන් වහන්සේ සතු මානුෂිය ගුණාංග, උත්තරීතර මානුෂිය ගුණාංග ලෙස සැලකෙන 'අසමො අසමසමො' යන ගුණ වාචක පද දෙකෙහි අදහස ලියා දක්වන්න**

1) බුදුරජාණන් වහන්සේ සාමාන්‍ය මිනිසුන්ට සමකළ නොහැකි බැවින් අසමො නම් වේ,
2) බුදුරජාණන් වහන්සේලා සමග පමණක් සම වන බැවින් අසමසමෝ නම් වේ.

**(ලකුණු 02යි)**

**(viii) "අනත්ථපදසංහිතා - නිවනට උපකාරයක් නොවන නිරර්ථක වාක්‍යවලින් යුක්ත" යන්නෙහි ඇතුළත් රාගාදී කෙලෙසුන් අවුස්සන ප්‍රබන්ධ වර්ග දෙකක් නම් කරන්න**

- කාව්‍ය
- නාටක
- ගීත
- කතන්දර

**ප්‍රබන්ධ වර්ග 2ක් සඳහා (ලකුණු 02යි)**

**(ix) අටවිසි රූප කලාප අතර 'චක්ඛුප්පසාද' රූපයෙහිලා බලපාන ඇසේ ආකාර දෙක ලියන්න**

i. සසම්භාර චක්ඛු
ii. පසාද චක්ඛු

**(ලකුණු 02යි)**

**(x) "උට්ඨාන විරියාදිගතේහි බාහාබල පරිචිතෙහි සෙදාවක්කිත්තෙහි - ධම්මිකෙහි ධම්මලද්ධෙහි භොගෙහි" යන්නෙහි සඳහන්, උපයන ලද ධනය ධාර්මික විය යුතු බවට සාධක දෙකක් මතුකොට දක්වන්න**


- උට්ඨාන වීර්යයෙන් යුක්ත වීම
- දෑත දෙපයේ මහන්සියෙන් යුක්ත වීම
- දහදිය වගුරුවා හරිහම්බ කිරීම
- දැහැමි ක්‍රමවලින්, දැහැමිව ලබන ලද්දක් වීම

**සාධක දෙකක් සඳහා (ලකුණු 02යි)**

**(මුළු ලකුණු 02×10 = 20යි)**

## 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා


**1 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය**




II පත්‍රයේ පළමු ප්‍රශ්නය සියලුම අපේක්ෂකයන් පිළිතුරු සැපයිය යුතු අනිවාර්ය ප්‍රශ්නයක් වේ. අංක 3.4 ප්‍රස්තාරය අනුව මේ ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රමාණය 98.9%කි. මෙම ප්‍රශ්නයට අනුකොටස් 10ක් ඇතුළත් අතර ඒ සඳහා ලකුණු 20ක් හිමිවේ. ඉන්

00 - 05 ප්‍රාන්තරයේ 44%ක් ද,
06 - 10 ප්‍රාන්තරයේ 44%ක් ද,
11 - 15 ප්‍රාන්තරයේ 10%ක් ද,
16 - 20 ප්‍රාන්තරයේ 2%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 11ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 12%ක් වන අතර අපේක්ෂකයන් 88%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නය කොටස් දහයකින් සමන්විත ය. එම කොටස් ත්‍රිපිටක ධර්ම විෂයයට අයත් විවිධ විෂය තේමා යටතේ සකස් කර ඇත.

| විෂය තේමාව | අනු කොටස |
|---|---|
| බුද්ධ චරිතය | (i), (vii) |
| චරිත කතා | (iv) |
| සූත්‍ර ධර්ම | (ii), (v) |
| විනය | (iii) |
| අභිධර්මය | (ix) |
| ධම්මපදය | (viii) |
| ධර්මය(දහම් කරුණු) | (vi), (x) |

- iv කොටසෙහි පහසුතාව 70%කි. මෙම කොටසින් විමසන්නේ ධර්මාශෝක රජුගේ දරුවන් පිළිබඳව ය. ධර්මාශෝක රජුගේ දරුවන් ලෙස මහින්ද කුමාරයා සහ සංඝමිත්තා කුමරිය පිළිබඳ ව අපේක්ෂකයන් බොහෝ දෙනෙක් දැනුවත් බව සිතිය හැකි ය. එබැවින් එම දැනුවත්බව මෙම කොටසෙහි ඉහළ සාධනයට හේතු වී තිබිය හැකි ය.

- iii හා x කොටස් සඳහා පිළිවෙලින් පහසුතාව 58%ක් හා 60%කි. මූලික පිරිවෙන් අවසාන විභාගයේ වැඩි අපේක්ෂකයන් ප්‍රමාණයක් භික්ෂූන් වහන්සේලා ය. උන්වහන්සේලා අතර නිරන්තරයෙන් එම කරුණු භාවිත වන බැවින් භාවිතයේ හුරුව එම කොටස් සඳහා සාපේක්ෂව ඉහළ සාධනයට හේතු වී තිබිය හැකි ය.

- ඉහත ප්‍රශ්නයේ කොටස් අතුරෙන් 3% අඩුම පහසුතාව ඇත්තේ අභිධර්මය ඇසුරෙන් සකසා ඇති ix කොටසට යි. එම කොටසින් විමසන 'සසම්භාර චක්ඛු'හා 'පසාද චක්ඛු' පිළිබඳ අපේක්ෂකයන් තුළ නිවැරදි අවබෝධයක් නොමැති වීම මෙම තත්වයට හේතුවක් විය හැකි ය.

- ධම්මපදය ඇසුරෙන් විමසා ඇති viii කොටස සඳහා පහසුතාව 5%කි. එයද අඩු මට්ටමකි. එම ප්‍රශ්නයේ දක්වා ඇති 'ප්‍රබන්ධ' යන පදය මෙම විෂයට අදාළ ව වටහා නොගැනීම මෙයට හේතුවක් වී තිබිය හැකි ය.

- සූත්‍ර ඇසුරෙන් සකස් කර ඇති v කොටසෙහි පහසුතාව 7%කි. ෂට් ශාස්තෘන් වහන්සේලා පිළිබඳ සාමඤ්ඤඵල සූත්‍රය ඇසුරෙන් සකසා ඇති මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේදී පාලි පාඨ පිළිබඳ අපේක්ෂකයන් තුළ ඇති අවබෝධය මඳකම හා එම අර්ථ මතක තබා නොගැනීම මෙම තත්වයට හේතු විය හැකි ය. පාලි පාඨවල අර්ථ පැහැදිලි වන සේ ඉගැන්වීම සිදු කිරීමෙන් හා එම කරුණු නිතර පාඩම් කිරීමට අපේක්ෂකයන් යොමු කිරීමත් මගින් සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

- සූත්‍ර ධර්මය ඇසුරෙන් සකසා ඇති ii කොටසේ පහසුතාව 12%කි. සඟ ගුණ පිළිබඳ විමසන i කොටසේ පහසුතාව 16%කි. කරුණු නිරවුල්ව මතක තබා නොගැනීම සාධනය අඩු වීමට හේතු වී තිබිය හැකි අතර මෙවැනි විෂය කරුණු මතක තබා ගැනීමට පහසුවන අයුරින් ඉගැන්වීම් කටයුතු සිදු කිරීම තුළින් සාධන මට්ටම ඉහළ නැංවීම සිදු කළ හැකි ය.

- vi හා vii කොටස්හි පහසුතාව ද 40%ට අඩු අගයකි. බුද්ධ ධර්මය හා බුද්ධ චරිතය ඇසුරෙන් සකසා ඇති මෙම ප්‍රශ්න කොටස්වලට අදාළ ධර්ම කරුණු ගැන අපේක්‍ෂකයන්ගේ දැනුවත්භාවය අඩු වීම මෙයට හේතුවක් විය හැකි ය.

- මෙම අනුකොටස් 10 සඳහා ලකුණු 20ක් ලබාගත හැකි වුවත් අපේක්ෂකයන්ගෙන් 88%ක් ම ලකුණු 10 හෝ ඊට වඩා අඩු ප්‍රමාණයක් ලබා ඇත. ත්‍රිපිටක ධර්මය විෂය නිර්දේශයේ බොහෝ කොටස් ආවරණය වන ලෙස සකසා ඇති මෙම ප්‍රශ්නයට අපේක්‍ෂකයන් වැඩි පිරිසක් සාර්ථක ලෙස ලකුණු ලබාගෙන නොමැති බව පැහැදිලි වේ. පාලි ගාථා හා පාඨවල අර්ථය අවබෝධවන ලෙස ඉගැන්වීම් කටයුතු සිදු කිරීමත්, යම් දහම් කරුණකට අදාළ ව ඇති කරුණු කිහිපයක් පහසුවෙන් මතකයේ තබා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත්ව ඉගැන්වීම් කටයුතු සිදු කිරීමත් මගින් සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි වනු ඇත. තවද අදාළ විෂය කරුණු නිරන්තර වණපොත් කිරීම මගින් මතක තබා ගැනීමට ශිෂ්‍යයන් හුරු කිරීම ද ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට ගත හැකි ක්‍රියාමාර්ගයකි.

## II කොටස

**2 ප්‍රශ්නය**

**(i) බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකයකු ලෙස හැඳින්වීමට භාවිත වන සූත්‍ර සාහිත්‍යයේ සඳහන් යෙදුම් දෙකක් සඳහන් කරන්න.**

- මග්ගවිදූ
- මග්ගකෝවිද
- මග්ගඤ්ඤූ
- මග්ගදස්සාවී

**පිළිතුරු දෙකක් සඳහා (ලකුණු 02යි)**

**(ii) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ මාර්ගෝපදේශකත්වය ප්‍රකට කළ අවස්ථා තුනක් දක්වන්න.**

- ධනයෙන් බලයෙන් පිරිපුන් රජදරුවන්ට, සිටුවරුන්ට මෙන්ම ඒකසාටක බමුණා වැනි දුගියන්ටත්,
- විවිධ මිනිස් ගුණ දහමින් හෙබි ගුණවතුන්ට මෙන්ම මිනිස් ගුණ දහමින් තොර තිරිසනුන් මෙන් ජීවත් වූ ගුණ හීනයන්ටත්,
- උපශාන්ත ගති පැවතුම් ඇත්තවුන්ට මෙන්ම අංගුලිමාල, ආලවක ආදී අශාන්ත, අදාන්තයන්ටත්,
- සිය දැන උගත්කමින්, මානයෙන් හිස උදුම්මාගත් සච්චක, බකබ්‍රහ්ම ආදීන්ටත්,
- කුලමානයෙන් උදම් වූ අග්ගික භාරද්වාජ, සුන්දරික භාරද්වාජ ආදීන්ටත්,
- කුල වාදයෙන් පීඩාවට පත් සුනීත, සෝපාක ආදීන්ටත්,

**යන මෙබඳු උදාහරණ තුනක් සඳහා (ලකුණු 03යි)**


**(iii) ''බුදුරජාණන් වහන්සේ මිනිසාගේ ලෞකික ජීවිතය ශිල්පයෙන් මෙන් ම ධනයෙන් පොහොසත් වීමටත් ගුණයෙන් ධාර්මික වීමටත් විවිධ සූත්‍ර දේශනාවලින් මග කියා දුන්හ.'' එබඳු සූත්‍ර දේශනා ඇසුරින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න.**

මංගල සූත්‍රය, පරාභව සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය, වෙළුද්වාර සූත්‍රය, පත්තකම්ම සූත්‍රය, අණන සූත්‍රය, වඩ්ඪී සූත්‍රය ආදී සූත්‍ර දේශනා ඇසුරෙන් මෙලොව දියුණුව, පරලොව දියුණුව හා ආධ්‍යාත්මික දියුණුව (නිවන) ට අදාළව කරුණු දක්වා තිබීම.

**(ලකුණු 05යි)**
**(මුළු ලකුණු 10යි)**

## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා


2 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය




II පත්‍රයේ II කොටසට අයත් ප්‍රශ්නයක් වන මෙම ප්‍රශ්නය අංක 3.4 ප්‍රස්තාරය අනුව තෝරාගෙන ඇති ප්‍රතිශතය 85.27%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.
ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 19%ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 31%ක් ද,
6 - 7 ප්‍රාන්තරයේ 23%ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 27%ක් ද,

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 50%ක් වන අතර අපේක්ෂකයන් 50%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




දෙවන ප්‍රශ්නය බුද්ධ චරිතය ඇසුරෙන් සකස් කර ඇත. දෙවන ප්‍රශ්නයේ කොටස් තුනේ ම පහසුතාව 50% වැඩි අගයක් ගෙන ඇත. මෙම ප්‍රශ්නයේ i කොටසේ පහසුතාව 52%කි. ii කොටසේ පහසුතාව 60%කි. iii කොටසේ පහසුතාව 56%කි. පෙළපොතේ මුල් පාඩම් අතර බුද්ධ චරිතය අන්තර්ගතවීමත්, නිරන්තරයෙන් භාවිත කිරීමත් මෙයට හේතු විය හැකි ය. එසේම අනිවාර්යයෙන් ප්‍රශ්න පත්‍රයේ අඩංගුවන ප්‍රශ්නයක් ලෙස අපේක්ෂකයන්ගේ වැඩි අවධානය යොමු වී තිබීම ද ඊට හේතු විය හැකි ය.
එම ප්‍රශ්නයේ පහසුතාව අඩු ම අගයක් ඇත්තේ i කොටස සඳහා ය. එම කොටස මගින් සූත්‍ර සාහිත්‍යයේ සඳහන් යෙදුම් දෙකක් පිළිබඳ විමසා ඇති අතර ඒ පිළිබඳ අපේක්ෂකයන්ගේ අඩු අවබෝධය මෙම තත්වයට හේතු වී තිබිය හැකි ය.
සම්බුද්ධ චරිතය ආශ්‍රිත කරුණු ශිෂ්‍යයන්ට පහසුවෙන් මතක තබා ගත හැකි ආකාරයට සිත් ගන්නා ලෙස ඉගැන්වීමේ ක්‍රමය සංවිධානය කර ගැනීම මගින් මෙම විෂය කරුණු සඳහා ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

**03 ප්‍රශ්නය**

**(i) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ලැබූ පැවිදි උපසම්පදාව නම් කොට, සම්බුද්ධ ශාසනයේ ශ්‍රාවකයන් වහන්සේලා අතරින් ලැබූ අගතනතුර දක්වන්න.**

ඕවාද පටිග්ගහණ උපසම්පදාව
ධූතංගධාරීන් අතරින් අගතනතුර

**(ලකුණු 02යි)**

**(ii) පිප්ඵලී මානවකයා ගෘහස්ථ ජීවිතය ගත කළ ආකාරය දක්වා, වර්තමාන ගෘහස්ථ ජීවිත ගත කරන්නන් වෙත එයින් සැපයෙන ආදර්ශ පෙන්වා දෙන්න.**

- මව්පිය ඔවදන් පිළිපැදීම, මව්පියන්ගේ සිත් නොරිදවා අවනතව ක්‍රියා කිරීම, (භද්‍රකාපිලානිය සමඟ විවාහ වීම) අවංකභාවයෙන් සිය අදහස් විවාහ වීමට පෙර සිය පෙම්වතියට ප්‍රකාශ කිරීම,ඉන්ද්‍රිය සන්තර්පනයෙහි ආසක්ත නොවීම, වස්තු තණ්හාවෙන් කටයුතු නොකිරීම, දෙමාපියන්ගේ අවැමෙන් සියලු වස්තුව බිරිඳට භාරදී පැවිදි වීමට යෑම.

**මේ ඇසුරින් පිළිතුර ලියා තිබීම ලකුණු 01යි.**
**වර්තමාන ගෘහස්ථයන්ට ලබාදෙන ආදර්ශ මතු කර තිබීම ලකුණු 02යි.**

**(ලකුණු 03යි)**

**(iii) සම්බුද්ධ ශාසනයෙහි ශ්‍රාවකයන් වහන්සේ නමක් ලෙස මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ ගුණමහත්වය ගෙනහැර දක්වා වර්තමාන භික්ෂු පරපුරට ඉන් ලබාදෙන ආදර්ශ සාකච්ඡා කරන්න.**

- උත්තම ශ්‍රාවකයෙකු ලෙස ශ්‍රාවක භාවය ප්‍රකට කරමින් තෙවැනි ශ්‍රාවකයන් වීම
- සිව්පිළිසිඹියාපත් රහත්බව සාක්ෂාත් කිරීම
- ධූතංගධාරීන් අතරින් අගතනතුරු ලබා ධූතංග සම්පූර්ණ කිරීම
- දිවිහිමියෙන් පිණ්ඩපාතයෙන් විසීම
- දිවිහිමියෙන් ආරණ්‍යකව විසීම
- සප්ත මහ පුරුෂ ලක්ෂණවලින් යුක්ත වූ නිසා බුදුරදුන්ට සමාන ලක්ෂණ ඇතැයි සලකා වනගතව නිහතමානීව වාසය කිරීම


**යන ගුණ මහත්වයට (ලකුණු 03යි)**

- භික්ෂූන් වහන්සේ ප්‍රතිපත්තිගරුක විය යුතු බව
- ශීලවන්තයෙකු විය යුතු බව
- ආධ්‍යාත්මිකව දියුණු විය යුතු බව
- ප්‍රඥාව දියුණු කොට අභිඥා - ධ්‍යාන, මාර්ගඵල ලැබිය යුතු බවට කටයුතු කිරීම
- අනතිමානීව ක්‍රියා කිරීම
- අප්පිච්ඡතා, සන්තුට්ඨිතා, සුභරතා ආදී ගුණවලින් යුක්ත විය යුතු බව ආදිය ආදර්ශ ලෙස සැලකිය හැකිය.

**මේ සඳහා (ලකුණු 02 යි)**
**(ලකුණු 05යි)**

**(මුළු ලකුණු 10යි**


## 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




අංක 3.4 ප්‍රස්තාරය අනුව 03 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 72.09%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්,

0 - 2 ප්‍රාන්තරයේ 27%ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 30%ක් ද,
6 - 7 ප්‍රාන්තරයේ 23%ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 20%ක් ද,

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 43%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 57%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු




බුද්ධ කාලීන ශ්‍රාවක චරිත ආශ්‍රයෙන් ප්‍රශ්නය සකස් කර ඇත. මෙම ප්‍රශ්නයේ i කොටසේ පහසුතාව 38%කි. ii කොටසේ පහසුතාව 48%කි. iii කොටසේ පහසුතාව ද 48%කි.
ප්‍රශ්නයේ i කොටසින් මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ලැබූ පැවිදි උපසම්පදාව පිළිබඳ විමසා ඇති අතර ඒ පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම අඩුවීම එම කොටස සඳහා පහසුතාව අඩු අගයක් ගැනීමට හේතුවක් විය හැකිය.
පෙළ පොතේ සෑම විෂය කරුණක් පිළිබඳව ම ශිෂ්‍ය අවධානය යොමුවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය සංවිධානය කර ගැනීම, විෂයානුබද්ධ ඇගයීම් ක්‍රම මගින් විෂය කරුණු තවදුරටත් තහවුරු වීමට කටයුතු කිරීම, අතිරේක පොතපත විෂය ඉගැන්වීමේ දී සම්බන්ධ කිරීමත් මගින් මේ සම්බන්ධ ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

**04 ප්‍රශ්නය**

**(i) 'පාරාජිකා' යන්නෙහි අදහස දක්වා, පාරාජිකාපත්තියකට පත් භික්ෂුවකගේ ස්වභාවය කවරකට උපමා කරන්නේ දැයි පෙන්වා දෙන්න.**

- පාරාජිකා වූයේ වෙයි. පිරිහුණේ වෙයි, ශ්‍රමණභාවයට වරම් නොලබන්නේ වෙයි, පැරදුණේ වන්නේය. මෙයින් කුමන හෝ අදහසක් දක්වීම ප්‍රමාණවත් ය.
- තාල වර්ගයේ ගසක එහි කරටිය සිඳී ගිය කල්හි නැවත නොවැඩෙන්නා සේ යන්න හෝ හිසසුන් පුරුෂයෙකු ජීවත් වීමට වරම් නොලබන්නා සේ යන්නයි.

**(ලකුණු 02යි)**

**(ii) 'කාය සංසග්ග' සංඝාදිසේසාපත්තිය ලියා එහි අර්ථය ගෙනහැර දක්වන්න.**

යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය, හත්ථගාහං වා වෙණිගාහං වා, අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස අංගස්ස පරාමසනං සංඝාදිසෙසා **(ලකුණු 01යි)**

කිසියම් භික්ෂුවක් රාගයට බැස රාගයෙන් පෙරළුණු සිතින් මාගමක් සමඟ අත ගැනීම හෝ කෙස්වැටිය ගැනීම හෝ අනෙක් අවයවයක් හෝ ස්පර්ශ කිරීම යන ආකාරයකින් කයින් ස්පර්ශ කිරීමකට පත් වේ නම් සංඝාදිසේසාපත්ති වෙයි.

**(ලකුණු 02යි)**
**(ලකුණු 02 + 01 = 03යි)**

**(iii) "සඤ්චරිත්ත සංඝාදිසේසාපත්තියේ" නිදානය දක්වා භික්ෂූන් වහන්සේ නමක් පාපසමාචාර වීමේ ආදීනව විචාරයට ලක් කරන්න.**

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙරහි වැඩ වාසය කරන සමයේ උදායි තෙරුන් වහන්සේ බොහෝ ගිහි කුලයන් සමඟ කුළුපගව වාසය කරති. මේ හිතවත්කම නිසාම ඒ ඒ කුලයන්හි වසන හිමියා මළ කාන්තාවන් හෝ කුල කුමරියන් හෝ පිළිබඳව වෙනත් කුලයන්හි තරුණයන් හමුව තොරතුරු පවසති. නැතහොත් එම තරුණයන්ගේ මව්පියන් හමුවේ පවසති. එම ගුණකථන අසා පැහැදුණු ඇතැම්හු ''අපි ඔවුන් නොහඳුනන්නෙමු'' ඔබ වහන්සේ මේ විවාහය පිළිබඳ තොරතුරු කියා ඉටුකර දෙන්නැයි කියති.උදායි තෙරණුවෝ එසේ කුල නිවෙස් වෙත ගොස් පණිවිඩ කියා විවාහ කර දෙති.

මෙකල එක් පුරාණ ගණකයකුගේ බිරියකට රූමත් දියණියක් වූවාය.ඇය පතා පැමිණි ආජීවක ශ්‍රාවකයෝ ගණකිය හමු වී ඔබගේ දියණිය අප පුතණුවන්ට විවාහ කර දෙන්නැයි කීහ. ඔවු න් නොහඳුනන බැවින් ගණකිය අකමැති විය. ඒ බව ආජීවක ශ්‍රාවක පිරිස උදායි තෙරුන්ට පවසා උන්වහන්සේගේ මාර්ගයෙන් විවාහය කර ගත්හ. මේ පුවත සැලවීමෙන් මහජනයා අතර භික්ෂූන් වහන්සේ පිළිබඳ විරෝධයක් ඇති විය. එය මුල්කොට බුදුරදුන් විසින් මෙම ශික්ෂාව පනවන ලදී.

**(ලකුණු 02යි)**

**පාපසමාචාර වීමේ ආදීනව**

- භික්ෂූන් වහන්සේ කුල සංග්‍රහ පිණිස කැප භූමියක හෝ අකැප භූමියක මල්පැල සිටුවීම, රෝපණය කරවීම, ඒවාට පැන් ඉසීම, මල් නෙලීම, මල්දම් ගෙතීම ආදි ක්‍රියා පාපසමාචාර ක්‍රියා ලෙස සැලකේ.

- භික්ෂූන් වහන්සේ කුලයන්හි ආවාහ විවාහ වීම් සඳහා තොරතුරු ගෙන යෑමත්, ඒ අනුව විවාහ සම්බන්ධතා ගොඩනැගීමත්, ඊට මැදිහත්ව පණිවුඩකරුවකු ලෙස ක්‍රියා කිරීම පාපසමචාර වීමකි.

- මේ නිසා ගිහි ජනතාව පාපසමාචාරී භික්ෂූන් වහන්සේ හා සෙසු භික්ෂූන් වහන්සේලා සම තත්ත්වයෙන් කල්පනා කිරීම.

- ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේ (පාප සමාචාර නොවූ) වෙත අගෞරවයෙන් සැලකීම හා කථා කිරීම.

- පාප සමාචාර භික්ෂූන් වහන්සේ ඡන්ද, ද්වේශ, භය, මෝහ යන සතර අගතියට පත්වීම.


- අගතිගාමී භික්ෂූන් වහන්සේ සිල්වත්, ගුණවත් උතුමත් වෙත අභියෝගාත්මකව නැගී සිටීම.

මේ ආදී කරුණුවලින් පිළිතුර ගොඩනගා තිබුණේ නම් **(ලකුණු 03යි)**

**(ලකුණු 03 + 02 = 05 යි)**

## 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**4 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය**





අංක 3.4 ප්‍රස්තාරය අනුව 04 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 32.97% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 46%ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 21%ක් ද,
6 - 7 ප්‍රාන්තරයේ 13%ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 33%ක් වන අතර අපේක්ෂකයන් 67%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




භික්ෂු විනයේ සතර පාරාජික සහ සංඝාධිසේස කොටස පිළිබඳ මෙම ප්‍රශ්නයෙන් විමසා ඇත. මෙම ප්‍රශ්නයේ i කොටසේ පහසුතාව 61%කි. ii කොටසේ පහසුතාව 35%කි. iii කොටසේ පහසුතාව 17%කි.
පෙළපොතේ අන්තර්ගත පාරාජිකා කොටස පරිශීලනය හොඳින් සිදුව තිබීම i කොටස සඳහා පහසුතාව සාපේක්ෂව වැඩි අගයක් ගැනීමට හේතු වී තිබිය හැකි ය.
ii,iii කොටස් සංඝාධිසේස ඇසුරින් විමසා ඇති අතර එම කොටස් පිළිබඳ අපේක්ෂකයන්ගේ අවධානය අඩු වීමත්, දැනුම මඳ වීමත් මෙම කොටස් සඳහා පහසුතාව අඩු අගයක් ගැනීමට බලපා තිබිය හැකි ය.

iii කොටසින් භික්ෂූන්වහන්සේ නමක් පාපසමාචාර වීම පිළිබඳ විමසා ඇති අතර එහි නිවැරදි අර්ථය අවබෝධ නොවීම පිළිතුරට ප්‍රවේශ වීමට බාධාවක් වී තිබීම ද, ඒ සම්බන්ධව අපේක්ෂකයන්ගේ අඩු අවබෝධය ද එම කොටසෙහි පහසුතාව අඩු අගයක් ගැනීමට යම් බලපෑමක් සිදුකර තිබිය හැකි ය. භික්ෂූන්වහන්සේට තම පැවිදි දිවිය සරු කර ගැනීම සඳහා භික්ෂු විනය ඉගෙනීම අත්‍යවශ්‍ය වේ. එබැවින් පෙළපොතේ අන්තර්ගත විනය කොටස් වඩාත් ප්‍රගුණ කරවීමෙන් මේ විෂය කරුණු සම්බන්ධ සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවිය හැකි අතර ම, සාර්ථක භික්ෂු ජීවිතයකට ද සමීප විය හැකි ය.

## III කොටස

**05 ප්‍රශ්නය**

**(i) 'සහස්සම්පි චෙ වාචා' යන ගාථාව සම්පූර්ණ කරන්න.**

සහස්සම පි චෙ වාචා - අනත්ථපද සංහිතා
ඒකං අත්ථපදං සෙය්‍යො - යං සුත්වා උපසම්මති

**(ලකුණු 02යි)**

**(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න.**

නිවනට උපකාරයක් නොවන නිරර්ථක වාක්‍යවලින් යුක්ත, වැකි දහසකට වඩා යමක් අසා කෙලෙසුන් සන්සිඳේ නම් එබඳු අර්ථවත් එක් පදයක් වුවද අසන්නට ලැබීම උතුම් වේ.

**(ලකුණු 03යි)**

**(iii) සැරියුත් තෙරුන් වහන්සේ අපරාධකරුවකු නිර්වාණ මාර්ගයට යැවූ තම්බදාඨික කථා පුවත ඉදිරිපත් කොට එයින් වර්තමාන සමාජයට ලබාදෙන පණිවුඩය සාකච්ඡා කරන්න.**

රජගහ නුවර පන්සියයක සොර මුලක් විය. දිනක් තඹපාට දැලි රැවුළක් ඇති තම්බදාඨික නමැත්තා සොර මුලට එක් වන්නට පැමිණ අවසර පැතීය. පුද්ගලයන් ගැන හොඳ අවබෝධයක් තිබූ සොර දෙටුවා මොහු මාපියන් වුවත් පාවාදෙන තරම් දුෂ්ටයෙකු යැයි සලකා ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. කෙසේ හෝ ඔහු සොරුන්ගේ සිත්ගෙන සොරමුලට එක්විය. මේ අතර රජයේ රාජපුරුෂයෝ සොරුන් අල්ලා අධිකරණයට ඉදිරිපත් කළහ. අධිකරණය සොරුන් සියලු දෙනාගේ හිස පොරොවෙන් ගසා දමන ලෙස නියෝග කළේය. රාජපුරුෂයෝ සොරුන් ඝාතනය කරන්නෙක් ඔවුන් අතරින්ම සොයා ගැනීමට කල්පනා කළහ. එහෙත් කිසිවෙකුත් ඉදිරිපත් නොවීය. අන්තිමේ දී ඉදිරිපත් වන්නාට නිදහසත්, සම්මානත්, ලබාදෙන බව දැන්වීය. හාරසිය අනූනව දෙනෙකු ම ඊට අකමැති වුවත් අවසානයේ තම්බදාඨික නමැත්තා එය භාර ගත්තේය. හෙතෙම සොරුන් සියලුදෙනා පොරොවෙන් ගසා මරාදමා නිදහසත්, සම්මානත්, දිනා ගත්තේය. එතැන් සිට රාජපුරුෂයන්ගේ නියමයෙන් අලුගෝසු තනතුරු දැරීය. වියපත් වූ පසු ඔහුව ධූරයෙන් නෙරපන ලදී. ඊට පසු පිළිවෙළකට හඳින්නට, පිරිසිදුව සිටින්නටත් හිසකෙස් රැවුල් කපාදමා නා ප්‍රසන්න තැනැත්තෙකු බවට පත්විය. දිනක් ගිතෙල් මිශ්‍ර කිරි කැඳක් සාදා බොන්නට සූදානම් වූ අවස්ථාවේ මොහුගේ පෙර කරන ලද පින් බලය බලවත් වී සැරියුත් තෙරුන් වහන්සේගේ දිවැස් නුවණට ගැටිණ. සැරියුත් තෙරුන් වහන්සේ ඔහුට පිහිට වීමට වැඩම කළහ.සැරියුත් තෙරුන් දැකතම්බදාඨික බලවත් සතුටට පත්ව උන් වහන්සේට අසුන් පනවා වඩා හිඳවා කැඳ පිළිගැන්වීය.

කැඳ වළඳා පුණ්‍යානුමෝදනා කළත් තම්බදාඨික නමැත්තාගේ බලවත් අකුසල කර්ම හේතුවෙන් අපරාධ සිහිපත් වීමෙන් ඔහුට සිත සනසා ගැනීමට නොහැකි විය. එහිදී සැරියුත් තෙරුන්ගේ අනුශාසනාව අසා සෝවාන් මාර්ගයට ආසන්න අනුලෝමික ඥානය උපදවා ගත්තේය.

**(ලකුණු 03යි)**


**සමාජයට ලබා දෙන පණිවුඩය**

- පාපයෙන් වැළකී ක්‍රියා කළයුතු බවටත්,
- නැවත නැවත පින් දහම් කළයුතු බවටත්,
- එසේ කරන ලද පිනේ පුණ්‍ය ශක්තිය කවදා හෝ විපාක දෙන බැවින් පින්දහම් කළයුතු බවට ත්, සමාජයට පණිවුඩයක් ලබා දෙයි.

**(ලකුණු 02 යි)**
**(ලකුණු 03 + 02= 05යි)**

## 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

**5 ප්‍රශ්නය හා ලකුණු ලබාගෙන ඇති ආකාරය**




අංක 3.4 ප්‍රස්තාරය අනුව 05 ප්‍රශ්නය තෝරා ගෙන ඇති පිරිස 72.09%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.


ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 26%ක් ද
3 - 5 ප්‍රාන්තරයේ 36%ක් ද
6 - 7 ප්‍රාන්තරයේ 14%ක් ද
8 - 10 ප්‍රාන්තරයේ 24%ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 38%ක් වන අතර අපේක්ෂකයන් 62% ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන්ය.

**5 ප්‍රශ්නයෙහි කොටස්වල පහසුතාව**




මෙම ප්‍රශ්නය ධම්මපදය ඇසුරින් සකස් කර ඇත. මෙම ප්‍රශ්නයේ i කොටසේ පහසුතාව 78%කි. ii කොටසේ පහසුතාව 57%කි. iii කොටසේ පහසුතාව 38%කි.

මෙම ප්‍රශ්නයේ i කොටසින් පාලි ගාථාවක් විමසා ඇති අතර අදාළ ගාථාව වණ පොත් කර තිබීම එම කොටස සඳහා පහසුතාව ඉහළ අගයක් වීමට හේතු විය හැකි ය.

ii කොටසින් පාලි පාඨයෙහි සිංහල අර්ථය විමසා ඇති අතර ඒ පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය අඩුවීම එහි පහසුතාව අඩු අගයක් වීමට හේතුවක් විය හැකි ය.

iii කොටසේ පහසුතාව ඉතා අඩු අගයකි. ගාථාවට අදාළ නිදාන කතාව පිළිබඳ අපේක්ෂකයන් තුළ නිරවුල් මතකයක් නොතිබීම ද, දන්නා විෂය කරුණු වුවද ප්‍රශ්නයට ගැලපෙන අකාරයට ලේඛනගත කිරීමේ අපේක්ෂකයන් තුළ ඇති දුර්වලතාව ද මෙයට හේතු විය හැකි ය. පාලි ගාථවල නිරවුල් අර්ථ වඩාත් පැහැදිලි ලෙස ප්‍රකාශ කිරීම සඳහා සිසුන් හුරුකරවීමත් , අදාළ නිදාන කථා මෙන්ම එම කරුණු සමාජයට ගලපා ගන්නා ආකාරය සාකච්ඡා කරමින්, එම කරුණු නිවැරදිව හා නිරවුල්ව ලේඛනගත කිරීමේ අභ්‍යාසවල සිසුන් නිතර යෙදවීමත් මඟින් මේ සඳහා සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

**06 ප්‍රශ්නය**

**(i) "කම්මස්සකා මානව සත්තා, කම්මදායාදා, කම්මයානි, කම්මබන්ධූ, කම්මපටිසරණා, කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායාති". මෙහි අර්ථය ලියා දක්වන්න.**

මානවකය, සත්‍වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ. කර්මය උරුම කොට ඇත්තාහ. කර්මයෙන් හට ගත්තාහුය,කර්මය ඥාතිකොට ඇත්තාහුය, කර්මය පිළිසරණ කොට ඇත්තාහුය. කර්මය සත්‍වයා උස් පහත් වශයෙන් බෙදා දක්වන්නේය. යනුයි.

**(ලකුණු 02යි)**

**(ii) කර්මය යනු චේතනාපූර්වාංගම ක්‍රියාව බවට දේශිත නිබ්බේධික සූත්‍ර පාඨයත්, එහි අර්ථයත් ලියන්න.**

චේතනාහං භික්ඛවේ කම්මං වදාමි චේතයිත්‍වා කම්මං කරෝති කායේන වාචාය මනසා.

**(ලකුණු 02යි)**

මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි. සිතින් සිතා කයින් හෝ වචනයෙන් හෝ සිතින්හෝ කර්ම කෙරෙයි.

**(ලකුණු 01යි)**
**(ලකුණු 02 + 03 = 03 යි)**

**(iii) බුදුදහම අනුව කර්මයෙහි දෙයාකාරය දක්වා, එසේ විමෙහිලා බලපාන මනෝමූලික තත්ත්වය පැහැදිලි කරන්න.**


**කර්මය දෙයාකාරයකි.**

එනම් කුසල කර්ම හා අකුසල කර්ම යනුයි. **(ලකුණු 02 යි)**

කුසල කර්ම හා අකුසල කර්ම වෙන් වෙන්ව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් ද බුදුදහමේ දක්නට ලැබේ. කිසියම් කුසල කර්මයක් කිරීමේ දී චේතනාව අලෝභ, අදෝස, අමෝහ යන කුසල මූලයකින් පිවිතුරුව පැවතියේ නම් එම කායික, වාචසික හා මානසික ක්‍රියා කුසල කර්ම වේ. චේතනාව ලෝභ, දෝස, මෝහ යන අකුසල මූලයකින් දූෂිතව පැවතියේ නම් එම ක්‍රියා කායික, වාචසික හා මානසික ක්‍රියා අකුසල ක්‍රියා වේ.
මනෝ මූලික තත්ත්වය වන්නේ අලෝභ, අදෝස, අමෝහ යන කුසල මූලික සිතිවිලිවලින් හෝ ලෝභ, දෝස, මෝහ යන අකුසල මූලික සිතිවිලිවලින් හෝ කර්ම සිදු කිරීමයි. එය මනෝ මූලික තත්‍වයයි.

**(ලකුණු 03 යි)**
**(ලකුණු 02 + 03 = 05 යි)**


## 6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා




අංක 3.4 ප්‍රස්තාරය අනුව 06 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 47.03%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්

0 - 2 ප්‍රාන්තරයේ 40%ක් ද,
3 - 5 ප්‍රාන්තරයේ 36%ක් ද,
6 - 7 ප්‍රාන්තරයේ 12%ක් ද,
8 - 10 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6 ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 24%ම් වන අතර අපේක්ෂකයන් 76%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක්




මෙම ප්‍රශ්නය කර්මය තේමා කරගනිමින් විමසා ඇත. මෙම ප්‍රශ්නයේ i කොටසේ පහසුතාව 42%කි. ii කොටසේ පහසුතාව 41%කි. iii කොටසේ පහසුතාව 34%කි.
මූලික ශ්‍රේණිවල සිට මෙම මාතෘකාව පිළිබඳ යම් අවබෝධයක් අපේක්ෂයන්ට ලබා දුන්නද මෙම ප්‍රශ්නයේ කොටස් තුනෙහි ම පහසුතාව 50%ට අඩු අගයකි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10න් අපේක්ෂකයන් 76%ක් ම ලබා ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩු අගයකි.
6 ප්‍රශ්නයේ i, ii කොටස් දෙකෙන්ම කර්මය සම්බන්ධ පාලි පාඨ හා ඒවායේ අර්ථ විමසා ඇති අතර ඒ සම්බන්ධව අපේක්ෂකයන්ට නිසි අවබෝධය නොමැති වීම අඩු සාධනය සඳහා හේතුවක් විය හැකි ය.
6 ප්‍රශ්නයේ iii කොටසේ පහසුතාව 34%ක් තරම් අඩු අගයකි. එම කොටසින් විමසා ඇති කුසලාකුසල කර්ම සඳහා බලපාන මනෝමූලික තත්වය යන පදය අපේක්ෂකයන් විසින් නිවැරදිව ගලපා නොග ැනීම එයට හේතුවක් විය හැකි ය.
කර්මය බුදු දහමේ ඉගැන්වෙන ගැඹුරු සංකල්පයක් බැවින් වඩාත් නිශ්චිත වූ අර්ථ සහ කරුණු පැහැදිලි කිරීම් ලබා දෙමින් ශිෂ්‍යයා තුළ මෙවැනි ගැඹුරු සංකල්ප තහවුරුවන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම වේද සංවිධානය කර ගැනීමෙන් මෙවැනි ප්‍රශ්න සඳහා ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

**07 ප්‍රශ්නය**

**(i) සෝභන චෛතසික රාශියේ අප්පමඤ්ඤා චෛතසික දෙක නම් කරන්න.**

1. කරුණා
2. මුදිතා

**(ලකුණු 02ය**

**(ii) එම අප්පමඤ්ඤා චෛතසික දෙක නිර්වචන ඇසුරින් හඳුන්වන්න.**

කරුණා
පරදුක්ඛෙ සති සාධූනාං හදය කම්පනං කරොතීති කරුණා සා පරදුක්ඛාපනයන කාමතා ලක්ඛණා.

අනුන්ගේ දුකෙහි දී සත්පුරුෂයන්ගේ හදවතේ ඇතිවන අනුකම්පාව කරුණාවයි. තමා දුකින් මිදීමට කැමැත්තක් දක්වන්නා සේම අනුන්ද දුකින් මුදවාලීමේ කැමැත්ත එහි විශේෂත්වයයි.

මුදිතා
මොදන්ති එතායාති මුදිතා සා පරසම්පත්ති අනුමෝදන ලක්ඛණා.
තමන්ට යම් සම්පත්තියක් ලැබුණහොත් සතුටු වන්නාක් මෙන් අනුන්ට ලැබෙන සැප දැක සතුටුවීම මුදිතාවයි. අනුන්ගේ සම්පත් දැක බොහෝ දෙනා ඊර්ෂ්‍යා උපදවතත්. එයට සතුටුවිය හැක්කේ මුදිතාව ගුණයෙන් යුක්ත අයට පමණි.

**නිර්වචන දෙකට ලකුණු 02යි.**
**එහි අර්ථ දැක්වීම ලකුණු 01යි**
**(ලකුණු 03 යි)**

**(iii) සෝභන සාධාරණ චෛතසික අතරින් "හිරි" හා "ඔත්තප්ප" චෛතසික දෙක හඳුන්වා, පුද්ගල සන්තානයෙහි පැවතිය යුතු එම චෛතසික ධර්ම දෙකෙහි නූතන සමාජ උපයෝගිතා සාකච්ඡා කරන්න.**

හිරි
හිරීයති කාය දුච්චරිතාදීහි ජිගුච්ඡතීති හිරි

වරදෙහි ලැජ්ජාවන කුල කාන්තාවක මෙන් කාය දුශ්චරිතාදී පාපයන්ට ඇති ලජ්ජා සහගත බවයි. සත්පුරුෂයෝ අකුසල් කිරීමට ලජ්ජාවෙති. ජීවිතයේ සාමාන්‍යයෙන් ඇතිවන ලජ්ජා සහගත බවද හිරි නමින් ගැනෙන අතර මෙහිදී විශේෂයෙන් අකුසල් කිරීමට ඇති ලජ්ජාව ගැනේ.

ඔත්තප්ප
ඔත්තප්පතීති ඔත්තප්පං පාපතො උත්තාසලක්ඛණං

පාපයට බියවන තැතිගන්නා ස්වභාවයයි. හිරි සහ ඔත්තප්ප දෙක ඇතිවිට පාපයෙන් වළකින හෙයින් ලොව පාලනය කරන ධර්මතා දෙකක් ලෙස සැලකේ. කරුණු හතරක් පදනම් කරගෙන බිය ඇති වේ.

අත්තවාද භය
පරානුවාද භය
දණ්ඩ භය
දුග්ගති භය යනු ඒ හතරයි. මේ නිසා බියෙන් වැළකේ.


**(ලකුණු 01 + 01 = 02 යි)**

වර්තමාන සමාජයේ පුද්ගලයා පාපයට ඇති ලැජ්ජාවෙන් ද පාපයට ඇති බියෙන් ද දුරස්ථව ඇති බව පෙනේ. පුද්ගලයා වේගයෙන් ප්‍රාණඝාත, අදත්තාදාන, කාම මිථ්‍යාචාරවල යෙදෙන බවත් බොරුව, කේලාම් කීම, හිස්වචන හා පරුෂ වචනයෙන් යුක්තව සමාජය මුලාකරන, රවටන වචන භාවිතයට නැඹුරු වී ඇති බවත්, විෂම ලෝභය, අනුන් නැසීමේ චේතනාව හා මිථ්‍යාදෘෂ්ටිකව අකුසල මූලික මනෝභාවයන්ගෙන් දූෂිතව ක්‍රියා කරන බවත් පෙනේ.

එබැවින් පුද්ගලයාට දස අකුසලින් මිදීමටත්, නිරවුල් ආත්මභාවයක් පවත්වා ගැනීමටත් බෙහෙවින් උපකාර වන්නේ හිරි, ඔත්තප්ප යන පාපයට ඇති ලැජ්ජාව හා පාපයට ඇති බියයි. පාපයෙන් මිදීමට හා මුදවා ගැනීමට මේ ධර්මතා දෙකෙහි උපයෝගීතාව ප්‍රබල බවත් පෙන්වා දී තිබිම.


**(ලකුණු 03 යි)**
**(ලකුණු 02 + 03 = 05 යි)**

**(ලකුණු**
**02 + 01 = 03 යි)ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා**




අංක 3.4 ප්‍රස්තාරය අනුව 07 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 27.3% කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන්
- 0 - 2 ප්‍රාන්තරයේ 50%ක් ද
- 3 - 5 ප්‍රාන්තරයේ 37%ක් ද
- 6 - 7 ප්‍රාන්තරයේ 6%ක් ද
- 8 - 10 ප්‍රාන්තරයේ 7%ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 13%ම් වන අතර අපේක්ෂකයන් 87%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.





මෙම ප්‍රශ්නය අභිධර්මයේ චෛතසික කාණ්ඩය ඇසුරින් විමසා ඇත. අනුකොටස් තුනේ ම පහසුතාව 50% අඩු අගයකි. i කොටස සඳහා පහසුතාව 25%ක් ද ii කොටස සඳහා පහසුතාව 11%ක් ද iii කොටස සඳහා පහසුතාව 40%ක් ද වේ. 7 ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දී ඇති අපේක්ෂකයන්ගෙන් 87%ක් ම ලබා ඇත්තේ ලකුණු 5ක් හෝ 5ට අඩු ප්‍රමාණයකි.

මෙම ප්‍රශ්නයේ i කොටසින් සෝභන චෛතසික රාශියේ අප්පමඤ්ඤා චෛතසික දෙක පිළිබඳ විමසා ඇති අතර එහි පිළිතුර සරල දහම් කරුණක් වුවත් අභිධර්මය විෂය කොටසට අනුව එය ඉදිරිපත් කර ඇති ආකාරය පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය ප්‍රමාණවත් නොවීම එහි පහසුතාව අඩු අගයක් ගැනීමට හේතු විය හැකි ය. එම ප්‍රශ්නයේ ii කොටසින් එම චෛතසික දෙක නිර්වචන ඇසුරින් හඳුන්වන ලෙස දක්වා ඇති අතර එම නිර්වචන නිසි ලෙස දැක්වීමට අපේක්ෂකයන් අසමත්වී ඇති බව පෙනේ. අපේක්ෂකයන් මේ විෂය කොටස් හා පාලි පාඨ පිළිබඳ පැහැදිලිව මතක තබා නොගැනීම මෙයට හේතු වී තිබිය හැකිය.

iii කොටස 'හිරි ඔත්තප්ප' යන පදයන්හි භාවිතය පිළිබඳ විමසා ඇති අතර එම විෂය කොටස් නිතර පරිශීලනය සිදුවීම නිසා අපේක්ෂකයන්ගේ ඒ පිළිබඳ අවබෝධයක් තිබීම එම කොටස සඳහා සාපේක්ෂ ඉහළ සාධනයක් පෙන්වීමට හේතුවක් විය හැකි ය.

අභිධර්මය බුදු දහමේ ඉගැන්වෙන ගැඹුරු සංකල්පයක් බැවින් හා බොහෝ අපේක්ෂකයන්ගේ ප්‍රියමනාප විෂයයක් නොවන බැවින්, ශිෂ්‍යයන් තුළ කැමැත්තක් ඇතිවන අයුරින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමත් ගැඹුරු කරුණු නිශ්චිතව වඩාත් නිවැරදිව නිරවුල් ආකාරයෙන් අවබෝධ වන අයුරින් විවිධ ඉගෙනුම් සම්පත් යොදා ගනිමින් අපේක්ෂයන් තුළ විෂයානුබද්ධ රුචිකත්වය වැඩි කිරීමත් ආදි උපක්‍රම මඟින් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

## 3.6 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්න තෝරා ඇති ආකාරය, ප්‍රශ්නවල පහසුතාව හා පිළිතුරු, සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




ප්‍රස්තාරය 3.4

**(RD/ 16 / 4/ MPF පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි)**

ත්‍රිපිටක ධර්මය විෂයයෙහි II පත්‍රයේ 1 ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයක් වන බැවින් එය 98.9% අපේක්ෂකයන් පිරිසක් තෝරාගෙන ඇත. නමුත් විෂය නිර්දේශයේ බොහෝ තේමා ආවරණය වන පරිදි එම ප්‍රශ්නයේ අනුකොටස් 10 සකස් කර ඇති අතර එම කොටස් සියල්ල ම පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය අඩුවීම එහි පහසුතාව අඩු අගයක් ගැනීමට හේතුවක් විය හැකි ය. ත්‍රිපිටක ධර්මය ඉගෙන ගැනීමේදී විෂය තුළ අන්තර්ගත තේමා සියල්ල ප්‍රශ්න පත්‍රයට ඇතුළත් වන බැවින් විෂය නිර්දේශයම අධ්‍යයනයට යොමුවිය යුතු අතර විෂය ඉගැන්වීමේදී ගුරුභවතුන් විසින්ද ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

I හා II කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් අපේක්ෂකයන් තෝරාගත යුතු ය. II කොටසේ බුද්ධ චරිතය (2) ප්‍රශ්නය, චරිත කතා (3 ප්‍රශ්නය), විනය (4 ප්‍රශ්නය) යන තේමාවලින් ප්‍රශ්න සකස් වී ඇත. II කොටසේ 2හා 3 ප්‍රශ්න අපේක්ෂකයන් වැඩි ප්‍රතිශතයක් තෝරාගෙන ඇති අතර , එම ප්‍රශ්නවල පහසුතාව ද වැඩි අගයකි. III කොටසේ ධම්ම පදය (5 ප්‍රශ්නය), ධර්මය (6 ප්‍රශ්නය), අභිධර්මය (7 ප්‍රශ්නය) යන තේමා වලින් ප්‍රශ්න සකස් කර ඇත. එම කොටසේ ද 5,6 ප්‍රශ්න අපේක්ෂකයන් වැඩි ප්‍රතිශතයක් තෝරාගෙන ඇති අතර එම ප්‍රශ්නවල පහසුතාව ද වැඩි අගයකි.

2,3,හා 5,6 ප්‍රශ්නවලට අදාළ තේමාවලට අයත් විෂය කරුණු කතන්දර ස්වරූපයෙන් මතක තබාගැනීමට පහසු නිසා එම විෂය කොටස් ස්මරණය පහසු වීමත්, භාවිතය වැඩිවීමත් එම විෂය කොටස් පිළිබඳ ශිෂ්‍ය රුචිකත්වය වැඩි වී තිබීමට හේතු විය හැකි ය. එම ප්‍රශ්නවල පහසුතාව සාපේක්ෂව වැඩි අගයක් ගැනීමට ද එය හේතුවක් වී තිබිය හැකි ය.

II හා III කොටස්වලින් අඩු ප්‍රතිශතයකින් අපේක්ෂකයන් තෝරාගෙන ඇති ප්‍රශ්න වනුයේ 4 හා 7 ප්‍රශ්නයයි. විනය හා අභිධර්මය තේමාවලට අයත් එම ප්‍රශ්නවලට අදාළ විෂය කරුණු මතක ගැනීමට අමාරුවීමත් නිතර පරිශීලනය නොකිරීමත් ඒ සඳහා ශිෂ්‍ය රුචිකත්වය අඩු වීමට හේතු විය හැකි අතර එය එම ප්‍රශ්න තෝරාගැනීම අඩුවීමටත් බලපා තිබිය හැකි ය.

එම විෂය කරුණු ඉගැන්වීමේදී විෂය කරුණු සරල ලෙස ඉගැන්වීමත් , නිවැරදි ව වණපොත් කිරීමට ශිෂ්‍යයන් හුරු කිරීමත්, ශිෂ්‍යයන් ස්වයං අධ්‍යයනයට යොමු කිරීමත් තුළින් එම තේමා පිළිබඳ ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමට කටයුතු කළ හැකි ය.

## 4 පිළිතුරු සැපයීමේදී අපේක්ෂකයන් අවධානය යොමු කළ යුතු කරුණු

- ප්‍රශ්න පත්‍රයේ පවත්නා මූලික උපදෙස් කියවා හොඳින් වටහා ගැනීමට උත්සාහය ගත යුතු යි.
- පිළිතුරු තෝරා ගැනීමේදී ඉතාම නිවැරදි පිළිතුරු තෝරා ගැනීමට උත්සාහ කළ යුතු ය.
- අනිවාර්ය ප්‍රශ්න හා තෝරාගත් ප්‍රශ්න වශයෙන් ද කොටස් හා අනුකොටස් වශයෙන් ද ප්‍රශ්න හොඳින් කියවා පිළිතුරු ලිවීමට ගත වන කාලය නිසි ලෙස කළමනාකරණය කිරීම පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. මේ සඳහා අතිරේක කියවීම් කාලය ඵලදායි ලෙස යොදා ගත යුතු ය.
- නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර සැපයීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීමද නොකළ යුතු ය.
- ව්‍යුහගත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ඇතැම් අපේක්ෂකයින් විචාරාත්මකව කරුණු ඉදිරිපත් කර ඇති බවක් නොපෙනේ. විෂය කරුණු සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමේ දුර්වලතා මග හරවා ගැනීමට කටයුතු කළ යුතු ය.
- සෑම පිටුවකම විභාග අංකය හා පිටු අංකය යෙදිය යුතු ය.
- I පත්‍රයට පිළිතුරු සැපයීමේදී පැන්සල භාවිතා නොකළ යුතු ය
- පිළිතුරු ලිවීමේදී නිල් හෝ කලු පෑන් පමණක් භාවිතා කළ යුතු ය.
- පිළිතුරු ලිවීමේ දී මකන දියර භාවිතා කිරීමෙන් වැළකිය යුතු ය.
- නිවැරදි හා පැහැදිලි අත්අකුරු භාවිතය ලකුණු ලබා ගැනීමට පහසු මාර්ගයක් බව මතකයේ රඳවා ගත යුතු යි.
- II පත්‍රයට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
- පිළිතුරු පත්‍ර ඇමිණීමේදී පිටු අංක නිවැරදිව තබා තදින් ගැට ගැසිය යුතු ය.

## 5 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය පිළිබඳ අදහස් හා යෝජනා

- විෂය කරුණු මතකයේ තබා ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී උචිත උපක්‍රම භාවිතා කල යුතුය.
- විෂය කරුණු වලට අදාළ අතිරේක පොතපත හා ලිපිලේඛන කියවීම සඳහා සිසුන්ට පෙළඹ වීම් ඇතිකළ යුතුය.
- පැවරුම් සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා සිසුන් උනන්දු කරවීම් යුතුය.
- වණපොත් කරණයේදී නිවැරදි උච්චාරණය සහ නිවැරදි ලේඛනය සඳහා පුහුණු කරවිය යුතුයි.
- විචාරාත්මක හා විස්තරාත්මකව ප්‍රශ්න වලට පිළිතුරු ලිවීම සඳහා හුරුව ඇති කල යුතුයි.
- මූලාකෘති ප්‍රශ්න පත්‍ර, අනුමාන ප්‍රශ්න පත්‍ර, පසු ගිය ප්‍රශ්න පත්‍ර අභ්‍යාස කරවා ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවීමට සම්බන්ධ සිසුන්ට පුහුණුවක් ලබාදිය යුතුය.
- ලකුණු දීමේ පටිපාටිය මගින් ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ලකුණු දීමේ ක්‍රමවේදය පිළිබඳ සිසුන් දැනුවත් කළ යුතුය.
- ත්‍රිපිටකය ඉගෙනීම ගිහි පැවිදි දෙපාර්ශවයේ ම වගකීමක් බව අවධාරණය කරවිය යුතුය.එය ශාසනික පැවැත්මට අත්‍යවශ්‍යම කරුණක් බව පැහැදිලි කරවිය යුතුය.